ලංකා විදුලිබල මණ්ඩලය සහ එහි පරිපාලිත සමාගම් - 2023

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා විදුලිබල මණ්ඩලයේ ("මණ්ඩලය") සහ එහි පරිපාලිත සමාගම්වල ("සමූහය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. පරිපාලිත සමාගම් වන එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් සහ ට්‍රින්කොමලී පවර් කම්පැනි ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගම් විසින් විගණනය කරන ලදි.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමූහය විසින් සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත මාගේ නිගමන පදනම් වී ඇත. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ සහ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමූහය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමූහය කටයුතු කර ඇති බව,
- සමූහයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **එල්.කේ.ඒ.එස් 1 – මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**<br>(i) ප්‍රමිතියේ 15 වැනි වගන්තිය අනුව මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුවේ නිර්වචනය සහ හඳුනාගැනීමේ නිර්ණායකවලට පටහැනිව වෙනම ආයතනයක් ලෙස මණ්ඩලය යටතේ මෙහෙයවන සේවක අර්ථසාධක අරමුදලේ වියදම වූ රු. මිලියන 54.44 ක් මණ්ඩලයේ වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගෙන තිබුණි. | අදාළ කාරණය නිවැරදි කර ඉදිරි මූල්‍ය වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලැබේ. ලංවිම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේදී මෙය නිවැරදි කරනු ලැබේ. | මණ්ඩලයේ වියදම් හඳුනා ගැනීම සම්බන්ධයෙන් එල්.කේ.ඒ.එස් 01 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ii) ප්‍රමිතියේ 69 වැනි වගන්තියට පටහැනිව, තොග ශේෂය යටතේ පෙන්වීම වෙනුවට රු. මිලියන 448.66 ක් වූ තොග ගැලපුම් ගිණුමේ හර ශේෂය වෙනත් ණය ගැතියන් යටතේ ද, රු. මිලියන 424.19 ක් වූ තොග ගැලපුම් ගිණුමේ බැර ශේෂය වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් යටතේ ද පෙන්වා තිබුණි. තවද, ඉහත තොග ගැලපුම් ශේෂයන් අතරින් තොග හිඟයට අදාළ රු. මිලියන 138.52 ක් වූ හර ශේෂය සහ තොග අතිරික්තයට අදාළ රු. මිලියන 128.1 ක් වූ බැර ශේෂය වසරකට වැඩි කාලයක් තිස්සේ තොග ගැලපුම් ගිණුමේ නිරවුල් නොවී පැවතුණි. | අවශ්‍ය නම්, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අදාළව එල්.කේ.ඒ.එස් 01 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |

| | | |
|---|---|---|
| **(ආ) එල්.කේ.ජී.එස් 2 - තොග** | | |
| ඉහත ප්‍රමිතියේ විධිවිධාන අනුව තථ්‍ය පිරිවැය යොදා ගැනීම වෙනුවට සිය ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන්හි පොදු කාර්ය පිරිවැය තක්සේරු කිරීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමිත පිරිවැය ක්‍රමය යොදා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පිළිවෙලින් එකතුව රු. මිලියන 3,166.1 ක් සහ රු. මිලියන 15,897.9 ක් වූ හිතකර පොදු කාර්ය අනුපාත විචලනයක් සහ අමුද්‍රව්‍ය මිල විචලනයක් පැවති බව හෙළිදරව් විය. එසේම, එකතුව රු. මිලියන 5,592.4 ක් වූ අහිතකර ගබඩා මිළ විචලනයක් පැවතුණි. ඒ අනුව, එම කාර්යයන්වලට අදාළ අවශ්‍ය තොරතුරු විගණන සඳහා ලැබී නොමැතිවීම හේතුවෙන් එමඟින් මූල්‍ය ප්‍රකාශනවල මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම් සහ ස්කන්ධයට වන බලපෑම නිවැරදිව තහවුරු කර ගැනීමට නොහැකි විය. | තථ්‍ය මිල ගණන් සහ සම්මත මිල ගණන් අතර පරතරය අවම කිරීම සඳහා ප්‍රමිත මිල ගණන් ද්වි-වාර්ෂිකව සමාලෝචනය කරන ලෙස මිලකරණ කමිටුවට උපදෙස් දී ඇත. ඉහත සඳහන් කළ ඒවාට අමතරව, ලංවිම ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් සිදු කරනු ලබන අතර, ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු, එක් එක් සමාගම බරිත සාමාන්‍ය තොග තක්සේරු කිරීමේ ක්‍රමය සමඟ ERP පද්ධතිය ක්‍රියාත්මක කරන්නේ නම්, මෙම ගැටළු ඉවත් වනු ඇත. | තොගවල පිරිවැය හඳුනා ගැනීම සම්බන්ධයෙන් එල්.කේ.ජී.එස් 02 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| **(ඇ)එල්.කේ.ජී.එස් 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි** | | |
| (i) දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ජී.එස් 16) 51 වැනි වගන්තියට අනුව, වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම්, වෙනස්කම් එල්.කේ.ජී.එස් 08 අනුව ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට තවමත් භාවිතා කරනු ලබන රු. මිලියන 214,809 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ලංවිම හි වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පිළිබඳ වාර්ෂික සමාලෝචනය ප්‍රායෝගික නොවන සැලකිය යුතු කටයුත්තකි. තවද, ලංවිම රු. බිලියන 955 ක වත්කම් පදනමක් ඇති සංවිධානයක් වන අතර විදුලි බලාගාර සහ සම්ප්‍රේෂණ මාර්ග වැනි ප්‍රධාන වත්කම් සංරචකවල සුවිශේෂත්වය සහ සංකීර්ණත්වය සැලකිල්ලට ගනිමින් වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කිරීම පහසු සහ ප්‍රායෝගික නොවේ.<br>කෙසේ වෙතත්, ඉදිරියට යමින්, සියලුම වත්කම්වල සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කරන බවටත්, ඇස්තමේන්තුවල සිදුවන කිසියම් වෙනසක් එල්.කේ.ජී.එස් 8 ට අනුකූලව හඳුනා ගන්නා බවටත් අපි සහතික කරනු ඇත. | මණ්ඩලය විසින් දැනටමත් භාවිතා කරනු ලබන සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් සම්බන්ධයෙන් එල්.කේ.ජී.එස් 16 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ii) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පසුගිය වර්ෂය සඳහා වාර්ෂික නියාමන බද්ද ලෙස රු. මිලියන 209.68 ක මුදලක් අය කර තිබුණි. කෙසේ වෙතත්, 2022 වර්ෂය සඳහා මණ්ඩලය විසින් රු. මිලියන 167.25 ක් පමණක් ගිණුම්ගත කර තිබුණු අතර රු. මිලියන 42.43 ක වෙනස ප්‍රමිතියේ 41 සහ 42 | 2022 මූල්‍ය වර්ෂයේදී, වාර්ෂික නියාමන බද්ද රු. මිලියන 167.25 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ද අනුමත කර ඇත. කෙසේ වෙතත්, 2023 දී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් එවන ලද ඉන්වොයිසිය අනුව ඉතිරි වාර්ෂික | වැරදි නිවැරදි කිරීමේදී එල්.කේ.ජී.එස් 08 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |

| | | |
|---|---|---|
| වගන්තිවලට අනුව අතීතයානුයෝගීව ගැලපීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ආරම්භක රඳවා ගත් අලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | නියාමන බද්ද ගෙවීමට අනුමත කර ඇත. එබැවින්, මෙය ඇස්තමේන්තුවල වෙනස්කම් ලෙස සලකනු ලැබේ, එබැවින්, ඉදිරිකාලීන ව්‍යවහාරය සඳහා ප්‍රමිතියෙන් අවසර දෙනු ලැබේ.<br>තවද, එය වැරැද්දක් ලෙස සලකනු ලැබුවද, අතීතානුයෝගීව ව්‍යවහාරය හෝ නැවත ප්‍රකාශනය සඳහා එම කාල සීමාව තුළ කළමනාකාරිත්වයේ අදහස පිළිබඳ උපකල්පන අවශ්‍ය වේ. 2022 සඳහා කළමනාකාරිත්වයේ අදහස රු. මිලියන 167.25 ක ඇස්තමේන්තුව අනුමත කිරීම මගින් පෙන්නුම් කර ඇත. එබැවින්, වැරැද්දක් නිවැරදි කිරීම සඳහා අතීතානුයෝගීව නැවත ප්‍රකාශනය කිරීම ප්‍රායෝගික නොවේ. | |

**(ඇ) එල්.කේ.ඒ.එස් 12 - ආදායම් බදු**

| | | |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ පැහැර හරින ලද බදු වාර්තාවට අනුව, 2015/2016 තක්සේරු වර්ෂයේ සිට 2022 වර්ෂය අවසානය දක්වා ආයතනික ආදායම් බදු, උපයන විට ගෙවන බදු සහ එකතු කළ අගය මත බදු සඳහා බදු සහ දඩ වශයෙන් ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු. මිලියන 36.62 ක්, රු. මිලියන 665.11 ක් සහ රු. මිලියන 97.5 ක් විය. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් අභියාචනා ඉදිරිපත් කර තිබුණද වර්ෂය අවසානය වන විටත් එම බදු සඳහා අවසන් තීරණයක් ලැබී නොතිබුණි. එසේ වුවද, ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 12) 88 වැනි වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල එය අනාවරණය කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී, සලකා බලනු ලබන බදු සහ දඩ මුදල් මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද අභියාචනාවලට යටත් වේ. මෙම අභියාචනා සඳහා අවසාන තීරණයන් ලැබීමට නියමිත අතර, මෙම මුදල් ගෙවිය යුතු බවට තවමත් තහවුරු කර නොමැත. මෙම මුදලට එරෙහිව කටයුතු කිරීමට සාධාරණ හේතු ඇති බව ලංවිම විශ්වාස කරන අතර, අභියාචනාවල ප්‍රතිඵලය මෙම වගකීම් ආපසු හැරවීමට හේතු විය හැක. අවශ්‍ය නම්, විනිවිදභාවය සහතික කිරීම සඳහා අප විසින් පසුකාලීන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සිදු කරනු ඇත. | බදු සම්බන්ධයෙන් නොවිසඳුණු ආරවුල් හෙළිදරව් කිරීමේදී එල්.කේ.ඒ.එස් 12 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |

**(ඉ) එල්.කේ.ඒ.එස් 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්**

| | | |
|---|---|---|
| වාරිමාර්ග අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2021 ඔක්තෝම්බර් 24 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව 2021 නොවැම්බර් 16 දිනැති අංක 21/1920/317/051 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ අනපේක්ෂිත ප්‍රමාදයන් සඳහා කොන්ත්‍රාත්කරු වෙත එ.ජ.ඩො මිලියන 38.612 ක හිමිකම් මුදල ගෙවීමට තීරණය වූ අතර මෙම ව්‍යාපෘතිය හරහා මණ්ඩලයට ලැබෙන ආදායම සැලකිල්ලට ගෙන එම අතිරේක ගෙවීම මණ්ඩලය විසින් ගෙවිය යුතු වේ. තවද, සියයට 50 ක් මුලින් ගෙවීමටත් ඉතිරි සියයට 50 දෝෂ | 2024 ඔක්තෝබර් මාසයේ ගිණුම් පිළියෙල කිරීම අතරතුර ව්‍යාපෘති අංශයේ ගිණුම් පොත්වල වගකීම සටහන් කර ඇත. කෙසේ වෙතත්, අධික ප්‍රමාද ගාස්තුව අඩු කිරීමට/ඉවත් කිරීමට අදාළ බලධාරීන් හරහා කොන්ත්‍රාත්කරු සමඟ නැවත සාකච්ඡා කිරීම නිර්දේශ කර ඇත. | වර්ෂය අවසානයේ ප්‍රතිපාදන හඳුනා ගැනීම සම්බන්ධයෙන් එල්.කේ.ඒ.එස් 37 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |

වගකීම් කාලය අවසන් වූ පසු ගෙවීමටත් තීරණය විය. කෙසේ වෙතත්, මණ්ඩලයේ ගිණුම් පොත්වලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී මුළු ප්‍රමාද ගාස්තුවෙන් සියයට 50 ට සමාන රු. මිලියන 6,227.3 ක මුදලක් පමණක් ගිණුම්ගත කර තිබූ අතර, එල්.කේ.ඒ.එස් 37 හි 14 වන වගන්තියට අනුව ඉතිරි එ.ජ.ඩො මිලියන 19.306 සඳහා වර්ෂය අවසන් වන විටත් කිසිදු ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඊ) **එස්.එල්.එෆ්.ආර්.එස් 09 - මූල්‍ය සාධන පත්‍ර**

| | | |
|---|---|---|
| (i) වෙළඳ ණය ගැතියන්ගේ අපේක්ෂිත ණය පාඩු හඳුනා ගැනීම සඳහා මණ්ඩලය විසින් නිශ්චිත ප්‍රවේශයක් සහ ක්‍රමවේදයක් හඳුන්වා දී තිබුණද, විවිධ ණය ගැතියන්, පූජනීය ස්ථානවලින් ලැබිය යුතු මුදල් ඇතුළු අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා එවැනි ප්‍රවේශයක් සහ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. ඒ අනුව, රු. මිලියන 213.49 ක් සහ රු. මිලියන 118.54 ක් වූ අනෙකුත් ලැබිය යුතු මුදල් වර්ෂ 1 සිට 5 දක්වා වූ කාලයක් තිස්සේ පිළිවෙලින් බෙදාහැරීමේ අංශය 01 සහ 04 හි හිඟව පැවතුණි. කෙසේ වෙතත්, පිළිවෙළින් රු. මිලියන 102.01 ක සහ රු. මිලියන 59.87 ක හානිකරණ ප්‍රතිපාදන පමණක් සලසා තිබුණි. තවද, බෙදාහැරීමේ අංශය 02 සහ 03 හි පිළිවෙලින් රු. මිලියන 142.37 ක් සහ රු. මිලියන 107.99 ක් වූ වර්ෂ 1 සිට 5 දක්වා වූ කාලයක් තිස්සේ පවතින හිඟ ශේෂය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. එසේම, වසර පහකට වැඩි කාලයක් තිස්සේ හිඟව පවතින රු. මිලියන 341.32 ක් වූ අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා අපේක්ෂිත ණය පාඩු නිසි ලෙස හඳුනා නොගෙන රු. මිලියන 74.35 ක හානිකරණ ප්‍රතිපාදන පමණක් සලසා තිබුණි. මෙම නිරීක්ෂණ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මූල්‍ය වත්කම්වල ධාරණ අගයේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | **බෙදාහැරීමේ අංශය 01**<br>අනෙකුත් ලැබිය යුතු මුදල් අයකර ගැනීමේ හැකියාව විශ්ලේෂණය කිරීමෙන් පසුව අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා අවශ්‍ය නිශ්චිත ප්‍රතිපාදන සැලසීමට පළාත්වලට උපදෙස් දෙනු ලැබේ. ප්‍රධාන වශයෙන් පූජනීය ස්ථානවලින් සහ විවිධ ණයගැති ශේෂයෙන් කොටසක් සඳහා ප්‍රතිපාදන සලසා ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය 02**<br>මෙය 2024 මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කර ඇත. 2024 වර්ෂයේදී දීර්ඝකාලීන හිඟ අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා සියයට 100 ක නිශ්චිත ප්‍රතිපාදනයක් සලසා ඇත. (පූජනීය ස්ථාන. මහින්ද චින්තනය, ගාස්තු රහිත සේවා සම්බන්ධතාවය) පූජනීය ස්ථානවල සහ මහින්ද චින්තනයේ හිඟ ශේෂයන් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.<br>**බෙදාහැරීමේ අංශය 03**<br>2024 මැයි මාසයේදී පූජනීය ස්ථානවලින් ලැබිය යුතු මුදල් සඳහා සම්පූර්ණ ප්‍රතිපාදනයක් ගිණුම්වලට සිදු කර ඇත. චක්‍රලේඛයට අනුකූලව ණය අවදානම වැඩිවීම සහ ශේෂයන් අයකර ගැනීමේ හැකියාව පිළිබඳ සාධාරණ ඇගයීමකින් පසු අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමට පියවර ගනු ලැබේ.<br>**බෙදාහැරීමේ අංශය 04**<br>හානිකරණය සඳහා අපි නිශ්චිත ප්‍රතිපාදන සලසා ඇත. | හානිකරණ සඳහා ප්‍රතිපාදන සැලසීම සම්බන්ධයෙන් එස්.එල්.එෆ්.ආර්.එස් 09 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ii) 2016/17 තක්සේරු වර්ෂයේ සිට 2019/20 තක්සේරු වර්ෂය දක්වා ගෙවන ලද රු. මිලියන 3,914 ක් වූ ආර්ථික සේවා ගාස්තුවේ (ඊ.එස්.සී) හිමිකම් කිව හැකි අවුරුදු දෙකක | 2024 වර්ෂය සඳහා පසුකාලීන මූල්‍ය ප්‍රකාශනවල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු, මෙම මුදල, වියදමක් ලෙස විස්තීර්ණ ආදායමට අය කරනු ඇත. | හානිකරණ සඳහා ප්‍රතිපාදන සැලසීම සම්බන්ධයෙන් එස්.එල්.එෆ්.ආර්.එස් |

| | | |
|---|---|---|
| කාල සීමාව සමාලෝචිත වර්ෂය අවසානයේදී ඉක්මවා තිබුණි. කෙසේවෙතත්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ වෙනුවට රු. මිලියන 3,914 ක හානිකරණ ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර තිබුණි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ඊ.එස්.සී හි ලැබිය යුතු ශේෂය ප්‍රමිතියේ විධිවිධාන අනුව මූල්‍ය වත්කම්වල නිර්වචනය සපුරාලන්නේ නැති බව නිරීක්ෂණය විය. | | 09 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලයේ අභ්‍යන්තර තක්සේරු කණ්ඩායම විසින් ලබා දෙන ලද තක්සේරුව අනුව, 2016 වර්ෂයේදී බෙදාහැරීමේ අංශය 04 හි ආයතනික අංශයෙන් ඉවත් කරන ලද ට්‍රාන්ස්ෆෝමර් සමාලෝචිත වර්ෂය සඳහා වන ගිණුම් පොත්වල රු. මිලියන 826.6 ක් තොගවලට සහ අනෙකුත් ගෙවිය යුතු මුදල්වලට පිළිවෙලින් හර සහ බැර කර තිබුණි. කෙසේ වෙතත්, එම ට්‍රාන්ස්ෆෝමර්වල අදාළ පිරිවැය සහ සමුච්චිත ක්ෂයවීම් ගිණුම් පොත්වලින් ඉවත් කර නොතිබූ අතර, තොරතුරු නොමැතිකම හේතුවෙන් එමඟින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | රු. මිලියන 421.17 ක් වූ 2023 වර්ෂය සඳහා වන ශේෂය අතරින්, රු. මිලියන 205.92 ක් 2024 දී නිරවුල් ඇත. ට්‍රාන්ස්ෆෝමර්වල පිරිවැය සහ සමුච්චිත ක්ෂයවීම් නිවැරදි ට්‍රාන්ස්ෆෝමර් අංකය සහ SIN අංකය හඳුනා ගැනීම මගින් ඉවත් කළ හැකිය. ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට පෙර නිවැරදි ට්‍රාන්ස්ෆෝමර් හඳුනා ගැනීම සඳහා අදාළ ඒකකවලින් නිවැරදි තොරතුරු කැඳවයි. | ඉවත් කරන ලද ට්‍රාන්ස්ෆෝමර්වල පිරිවැය සහ සමුච්චිත ක්ෂයවීම් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) තොග සමීක්ෂණ මණ්ඩලය විසින් කරන ලද සමීක්ෂණයෙන් 2023 සැප්තැම්බර් 15 වන දිනට පැරණි ගල් අඟුරු තොගය ගණනය කර තිබුණි. 2023 සැප්තැම්බර් 15 වන දිනට ගල් අඟුරු අංගනයේ පැවති තාප ගල් අඟුරු තොගය ඉහත ගණනය කළ පැරණි ගල් අඟුරු තොගය භාවිතයෙන් මනිනු ලැබූ අතර, ඩෙෆ් ගල් අඟුරු (deaf coal) තොගය, ගණනය කළ පැරණි ගල් අඟුරු තොගය ඉක්මවීම හේතුවෙන් තාප ගල් අඟුරු තොගය සෘණ මෙට්‍රික් ටොන් 14,964.71 ක් විය. එබැවින්, 2023 සැප්තැම්බර් 15 වන දිනට ගල් අඟුරු අංගනයේ පැවති තාප ගල් අඟුරු තොගය අවම වශයෙන් ශුන්‍ය ලෙස සැලකිය යුතුය. ඒ අනුව, ගල් අඟුරු බංකර්වල පැවති ගල් | වාර්ෂික ගල් අඟුරු සත්‍යාපනය සඳහා තාප ගල් අඟුරු පමණක් සලකා බලයි. මෙම නිශ්චිත දිනයේ, බංකර්වල ඉතිරිව ඇති ගල් අඟුරු සහ යාත්‍රා අංක 369 න් ගොඩබාන ලද ගල් අඟුරු හේතුවෙන් තාප ගල් අඟුරු තොග ශේෂය මෙට්‍රික් ටොන් 27,171.39 දක්වා රැස් වී තිබුණි. කෙසේ වෙතත්, මෙට්‍රික් ටොන් 14,964.71 ක් වූ ඩෙෆ් ගල් අඟුරු සෘණ ශේෂය නැවත පිරවීම හේතුවෙන් මෙම ප්‍රමාණය මෙට්‍රික් ටොන් 12,206 දක්වා පහත වැටුණි. එබැවින්, තාප ගල් අඟුරුවල නිශ්චිත භෞතික ශේෂය මෙට්‍රික් ටොන් 12,206 ක් විය. 2023.09.15 දිනට තාප ගල් අඟුරුවල පොත් ශේෂය මෙට්‍රික් ටොන් 36,457.76 ක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමීක්ෂණ මණ්ඩලය | ගල් අඟුරු තොග සත්‍යාපනයේදී ඩෙෆ් ගල් අඟුරු සලකා බැලීම සඳහා නිවැරදි ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු අතර භෞතික තොග ගණනය කිරීම නිවැරදි හා සම්පූර්ණ විය යුතුය. |

| | | |
|---|---|---|
| අඟුරු තොග සහ ගොඩබාන ලද නව ගල් අඟුරු තොග සලකා බැලීමෙන් පසු තාප ගල් අඟුරු තොග හිඟය මෙට්‍රික් ටොන් 9,286.37 ක් ලෙස ගත යුතුය. කෙසේ වෙතත්, ඉහත සඳහන් ගල් අඟුරු තොගයේ සෘණ ශේෂය සලකා බලා සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයට රු. මිලියන 1,778.6 ක් වටිනා මෙට්‍රික් ටොන් 24,251 ක තාප ගල් අඟුරු තොග හිඟයක් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව, විගණනය මගින් සිදු කරන ලද ගණනය කිරීම්වලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය සහ ගල් අඟුරු තොගය රු. මිලියන 924.3 කින් අඩුවෙන් දක්වා තිබුණි. | විසින් තීරණය කරන ලද තාප ගල් අඟුරු තොග හිඟය මෙට්‍රික් ටොන් 24,251.08 ක් විය. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය සහ ගල් අඟුරු තොගය අඩුවෙන් දැක්වීමක් සිදු වී නොතිබුණි. | |
| (ඇ) තුන්වන සහ සිව්වන කාර්තුව සඳහා ඒකාකාර මිල ජාතික ගාස්තු ගැලපීම් (UNT) ඇස්තමේන්තු සඳහා කිසිදු ප්‍රතිපාදනයක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලංකා විදුලි (පුද්ගලික) සමාගම (ලෙකෝ) වෙත කරන ලද බලශක්ති විකුණුම් ආදායම රු. මිලියන 1,120.1 කින් අඩුවෙන් දක්වා තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙතින් තීරණ ලේඛන ලබා ගැනීමෙන් පසු UNT ගැලපීම් සිදු කරනු ලබයි. මේ දක්වා කිසිදු කාර්තුවක් සඳහා UNT තීරණ ලේඛන ලැබී නොමැති බැවින්, නිල ලේඛන ලැබෙන තුරු සඳහන් කරන ලද වැරැද්ද නිවැරදි කළ නොහැක. | කාර්තු හතර සඳහාම මූල්‍ය ප්‍රකාශනවල ඒකාකාර මිල ජාතික ගාස්තු සඳහා ගැලපීම් සිදු කළ යුතුය. |
| (ඈ) සම්පූර්ණ කරන ලද රු. මිලියන 18,230 ක් වටිනා කාර්යයන් 8,574 ක් ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවතුණි. කෙසේ වෙතත්, එම වත්කම්වලට අදාළව ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වන ලාභයට සහ රඳවා ගත් ඉපැයීම්වලට එමඟින් ඇති කරන බලපෑම, තොරතුරු නොමැතිකම හේතුවෙන් තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද, සිදු කරන ලද අහඹු පරීක්ෂණයට අනුව, ඉදිකිරීම් සියල්ල දැනටමත් අවසන් කර මණ්ඩලය විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණද බෙදාහැරීමේ අංශය 04 හි ඉදිකිරීම් අංශයේ (දකුණු පළාත 2) රු. මිලියන 2.98 ක් වටිනා කාර්යයන් දෙකක්, ජා-ඇල ප්‍රදේශීය ඉංජිනේරු කාර්යාලයට වැය කළ රු. මිලියන 113.99 ක් සහ ගොඩනැගිලි තුනක් ඉදිකිරීම සඳහා හා කතරගම වීදි ආලෝකකරණය සඳහා වැය කළ | **බෙදාහැරීමේ අංශය 01**<br>සම්පූර්ණ කරන ලද කාර්යයන් නිතිපතා වත්කම්වලට මාරු කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාවලියක යෙදී සිටී.<br>**බෙදාහැරීමේ අංශය 02**<br>2024.10.31 දිනෙන් අවසන් වූ කාලපරිච්ඡේදය තුළදී, පෙර වසරවලට අදාළව රු. මිලියන 3,897 ක පිරිවැයක් සහිත කාර්යයන් සම්පූර්ණ කර වත්කම්වලට මාරු කර ඇත. තවද, ජා-ඇල ප්‍රදේශ ඉංජිනේරු කාර්යාලයේ ඉදිකිරීම් පිරිවැය දැනටමත් 2024 අප්‍රේල් මාසයේදී වත්කම්වලට මාරු කර ඇත.<br>**බෙදාහැරීමේ අංශය 03**<br>බෙදාහැරීමේ අංශය 03 ට අදාළව වසර දෙකකට වැඩි කාර්යයන් 1,913 අතරින්, රු. මිලියන 1,816 ක වටිනාකමකට කාර්යයන් 1,217 ක් (සියයට 64) 2024 ඔක්තෝබර් අවසානයෙදී නිරවුල් කර ඇත. | කෙරීගෙන යන වැඩ ශේෂවල ඇති සම්පූර්ණ කරන ලද කාර්යයන් ප්‍රාග්ධනිත කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| රු. මිලියන 135.61 ක් වර්ෂය අවසන් වන විටත් ප්‍රාග්ධනිත කර නොතිබූ බව නිරීක්ෂණය විය. තවද, ඉහත කෙරීගෙන යන වැඩ ශේෂයන් අතුරින්, රු. මිලියන 40.15 ක් වූ අමාත්‍යාංශ අරමුදල් යොදවා සිදු කරන ලද කාර්යයන්, වසර 5 කට වැඩි කාලයක් තිස්සේ බෙදාහැරීමේ අංශය 04 හි පවතුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබූ අතර ඒවා පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | **බෙදාහැරීමේ අංශය 04**<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාගේ අධීක්ෂණය යටතේ කෙරීගෙන යන වැඩ නිරීක්ෂණය කිරීම සඳහා අදාළ ඒකක ප්‍රධානීන් සහ ගණකාධිකාරී වියදම් අතර අඛණ්ඩ රැස්වීම් පවත්වනු ලබයි. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමට පෙර කෙරීගෙන යන වැඩ ප්‍රාග්ධනිත කිරීම කඩිනම් කරන ලෙස සහ ප්‍රගතිය අපට දැනුම් දෙන ලෙස අදාළ අංශයට දැනුම් දීමට මූල්‍ය අංශය විසින් කටයුතු කර ඇත. | |
| (ඉ) නිරවුල් කිරීමෙන් තොරව කාර්යයන් 122 කට අදාළ අසාමාන්‍ය බැර ශේෂයන් හිලව් කිරීම හේතුවෙන් බෙදාහැරීමේ අංශය 01, 02 සහ 03 හි මුළු කෙරීගෙන යන වැඩ ශේෂය රු. මිලියන 93.7 කින් අඩුවෙන් දක්වා තිබුණි. | **බෙදාහැරීමේ අංශය 01**<br>එවැනි ශේෂයන් නිරවුල් කිරීමට අදාළ ගණකාධිකාරීවරුන්ට උපදෙස් දී ඇත.<br>**බෙදාහැරීමේ අංශය 02**<br>කෙරීගෙන යන වැඩ ගිණුමට කරන ලද බොහෝ බැර සටහන්, ආපසු ලබා දෙන කාර්යයන්වල ඉතිරි ද්‍රව්‍යවල වටිනාකම හෝ විවිධ හේතූන් මත කාර්යයන් අවලංගු කිරීම හේතුවෙන් ආපසු ලබා දෙන ලද ද්‍රව්‍යවල පිරිවැය නියෝජනය කරයි.<br><br>**බෙදාහැරීමේ අංශය 03**<br>බැර ශේෂයට ප්‍රධාන හේතුව ද්‍රව්‍ය චලනයන්හි මිල වෙනසයි (මිල විචලනය). මෙම සියලු ශේෂයන් දැන් නිරවුල් කර ඇත. | කෙරීගෙන යන වැඩවල අසාමාන්‍ය බැර ශේෂයන් විමර්ශනය කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය (අදියර ii) සඳහා මිලදී ගත් රු. මිලියන 124.30 ක් වටිනා වාහන හයක් 2014 වර්ෂයේදී ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුවද ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර ඒ වෙනුවට එම මුදල කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබුණි. තවද, මෙම වාහනවල පිරිවැය ඒ වන විටත් අදාළ ව්‍යාපෘතියේ පිරිවැයට ඇතුළත් කර තිබුණද මෙම වාහන හය සහ පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ (අදියර i) තවත් වාහන 11 ක් මණ්ඩලයට පවරා ගැනීමට සහ භාරකාරත්වය තබා ගැනීමට නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | දැනට ලංවීම නඩු පැවරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. මෙම කාරණය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ප්‍රධාන නීති නිලධාරියා විසින් 2024 ඔක්තෝබර් 03 වන දින නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර නීතිපති දෙපාර්තමේන්තුවෙන් වැඩිදුර මඟ පෙන්වීමක් බලාපොරොත්තුවෙන් සිටී. | මෙම වාහන පවරාගෙන භාරකාරත්වය තබා ගැනීමට සහ ඒවා ප්‍රාග්ධනිත කිරීමට වහාම කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (උ) විමර්ශනය කර නිරවුල් කිරීමට නිසි ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව රු. මිලියන 113.87 ක් වූ මාර්ගස්ථ තොග ශේෂය වසරකට වැඩි කාලයක් තිස්සේ ගිණුම් පොත්වල පැවතුණි. බෙදාහැරීමේ අංශය 01 හි රු. මිලියන 129.52 ක් වූ මුළු මාර්ගස්ථ තොග ශේෂය අතුරින්, රු. මිලියන 34.56 ක් වසර 5 කට වඩා වැඩි කාලයක් තිස්සේ සැපයුම්කරුවන් සතු පවතින තොග නියෝජනය කර තිබුණි. තවද, බෙදාහැරීමේ අංශය 02 හි රු. මිලියන 432.3 ක් වූ මාර්ගස්ථ තොග ශේෂය අතුරින්, රු. මිලියන 142.61 ක් හෙවත් සියයට 33 ක් ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම වෙත නිකුත් කර තිබූ (කි.ග් 918,830) භාවිතා කළ නොහැකි ඇලුමිනියම් තොගයේ වටිනාකම නියෝජනය කරන අතර ආසන්න වශයෙන් වසර 2 ක කාලයක් තිස්සේ පැවතුණි. කෙසේ වෙතත්, 2021 සැප්තැම්බර් 23 දිනැති අංක 2021/GM/40/DCC චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව එම වටිනාකම එම සමාගමෙන් මණ්ඩලයට ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | **බෙදාහැරීමේ අංශය 01**<br>මේ සම්බන්ධයෙන් සමහර ලේඛනගත සාක්ෂි සොයා ගැනීමට අපහසු වන අතර ලේඛනගත සාක්ෂි ලබා ගත් පසු එවැනි ශේෂයන් නිරවුල් කරනු ඇත.<br>**බෙදාහැරීමේ අංශය 02**<br>ශ්‍රී ලංකා එනර්ජීස් වෙත භාර දෙන ලද භාවිතා කළ නොහැකි ඇලුමිනියම් තොගය හැර, රු. මිලියන 36 න්, වසර 4-5 ක් පැරණි රු. මිලියන 1.3 ක් 2024 ජුනි මාසයේ ගිණුම්වල නිරවුල් කරන ලද අතර ඉතිරි රු. මිලියන 33.4 ට අදාළ ටෙන්ඩර්ස් P&D ශාඛාව වෙත යොමු කරන ලද අතර, බෙදාහැරීමේ අංශය 02 හි P&D ශාඛාව විසින් කටයුතු සිදු කරමින් සිටී.<br>**බෙදාහැරීමේ අංශය 03**<br>මෙම ගැටළුව සබරගමුව සහ බස්නාහිර පළාත දකුණ 2 ට අදාළ වේ. වසරකට වැඩි ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගනු ඇත.<br>**බෙදාහැරීමේ අංශය 04**<br>බස්නාහිර පළාත දකුණ 1 විසින් දීර්ඝ කාලීන හිඟ මාර්ගස්ථ තොග නිරවුල් කර ඇති අතර 2024 ජුනි මාසයේදී ගිණුම් පොත් යාවත්කාලීන කිරීමට පියවර ගනු ඇත. තවද, දකුණ පළාත 2 හි ශේෂය දැනටමත් නිරවුල් කර ඇත. | දීර්ඝ කාලීන හිඟ මාර්ගස්ථ තොග ශේෂ විමර්ශනය කර ඒවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ)2019 සැප්තැම්බර් 24 දිනැති අංක 19/2622/113/074 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ලක්විජය බලාගාරය ව්‍යාප්ති ව්‍යාපෘතිය සඳහා මණ්ඩලය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 167.31 ක වියදමක් දැරීමෙන් අනතුරුව, 2021 සැප්තැම්බර් 13 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව 2021 ඔක්තෝබර් 26 දින ව්‍යාපෘතිය වසා දැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන තිබුණි. කෙසේ වෙතත්, වර්ෂයේ ලාභයට එරෙහිව අය කිරීමෙන් තොරව 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 167.62 ක මුදල කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ යටතේ පැවතුණි. | අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) විසින් කපා හැරීම සඳහා අනුමැතිය ඉල්ලා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර, මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය තවමත් ලැබීමට නියමිතය. | මූල්‍ය ප්‍රකාශනවල පවතින ශේෂයට ප්‍රතිපාදනයක් සැලසීමට හෝ කපා හැරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (එ) ලක්විජය විදුලි බලාගාරයේ වත්කම් ලේඛනයේ මණ්ඩලය සතු වාහන 03 ක වටිනාකම සහ එහි සමුච්චිත ක්ෂයවීම් සටහන් කර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඒවා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | මෙම කාරණය දැනට විසඳා ඇත. මෙම වාහන තුනේ වටිනාකම දැනටමත් 2024 අප්‍රේල් මාසයේ ගිණුම්වලට ගෙන ඇත. | ගිණුම් පොත්වල මෙන්ම ස්ථාවර වත්කම් ලේඛනයේද වාර්තා නොකළ වත්කම් ශේෂයන් වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) රු. මිලියන 34,386.77 ක් වටිනා වේලි වැඩ මහවැලි සංකීර්ණයේ දේපල පිරියත හා උපකරණවල සිවිල් වැඩ යටතේ පෙන්වා තිබුණි. කෙසේ වෙතත්, එම මුදලේ නිරවද්‍යතාවය සහ අදාළ වත්කම් සම්බන්ධව මණ්ඩලයට ඇති හිමිකම පිළිබඳව විගණනයේ දී තහවුරු කර ගැනීමට නොහැකි විය. | මෙම කරුණ සාකච්ඡා කිරීම සඳහා අප විසින් 2024.06.24 දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධාරීන් සමඟ රැස්වීමක් පැවැත්වූ අතර, 2023 වර්ෂයේදී වේලිවල පිරිවැය ඔවුන්ගේ ගිණුමට ගෙන ඇති බව එහිදී අනාවරණය විය. එබැවින්, සංවිධාන දෙකෙහිම ඉහළ කළමනාකාරිත්වයේ අනුමැතියට යටත්ව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කමිටුව තීරණය කර ඇත. | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල වේලි වැඩවල වටිනාකම සහ අයිතිය පිළිබඳ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි ව්‍යාපෘතියේ හිඟ ණය ශේෂය සම්බන්ධයෙන් මහජන බැංකුවෙන් ලද බැංකු ශේෂ තහවුරු කිරීම අනුව, රු. මිලියන 5,444.76 ක හිඟ මුදලක් දක්වා තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලයේ වාර්තාවලට අනුව, එය රු. මිලියන 5,494.76 ක් වූ අතර එම නිසා රු. මිලියන 50 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, විදුලිබල සැපයුමේ චිරස්ථායීතාවය වැඩිදියුණු කිරීමට සහය වීමේ ව්‍යාපෘතියේ හිඟ ණය ශේෂය සම්බන්ධයෙන් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද බැංකු ශේෂ තහවුරු කිරීම අනුව, එ.ජ.ඩො 57,338,901 ක හිඟ මුදලක් දක්වා තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලයේ වාර්තාවලට අනුව, එය එ.ජ.ඩො 57,989,633 ක් වූ අතර එම නිසා එ.ජ.ඩො 650,732 ක වෙනසක් නිරීක්ෂණය විය. | සටහන් කර ගෙන ඇති අතර එය දැනටමත් මූල්‍ය ප්‍රකාශනවල ගලපා ඇත. | ණය ශේෂවල වෙනස්කම් හඳුනා ගැනීමට සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කිරීමට සහ හඳුනාගත් වැරදි සඳහා ගිණුම් පොත් ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ශේෂය රු. මිලියන 308.1 ක් විය. කෙසේ වෙතත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, අනුරූප ලැබිය යුතු ශේෂය | 2020 දෙසැම්බර් 31 දින දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවිය යුතු ශේෂය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගිණුම්වල අනුරූප ලැබිය යුතු ශේෂය සැසඳීම සිදු කර ඇත. ගැටළු විසඳීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් කමිටුවක් පත් කර ඇති අතර අමාත්‍යාංශ ලේකම්වරයාගේ | අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් අනුව වෙනස්කම් සසඳා වෙනස්කම් අවම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| රු. මිලියන 3,529.6 ක් වූ අතර රු. මිලියන 3,221.5 ක වෙනසක් නිරීක්ෂණය විය. | උපදෙස් අනුව වෙනස්කම් අවම කිරීමට කටයුතු කරනු ඇත. | |
| (ඇ)බෙදාහැරීම් අංශය 1 හි හඳුනා නොගත් රු. මිලියන 423.76 ක ණයගැති ශේෂයක් 2012 වසරේ සිට හිඟව පැවතුණි. කෙසේ වෙතත්, එයින් රු. මිලියන 185.41 ක මුදලක් බලපෑමට ලක් වූ තනි තනි ණයගැති ගිණුම් විමර්ශනය කර ගැලපීමෙන් තොරව 2015 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා බෙදාහැරීමේ අංශවල ණයගැති පාලන ගිණුම්, වෙනත් වගකීම් ගිණුම් ආදිය වෙත මාරු කර තිබුණි. | මුල් වටිනාකම රු. මිලියන 423.76 ක් වූ ණයගැති ශේෂයන් අතරින් රු. මිලියන 185.41 ක මුදලක්, 2018 අගෝස්තු 17 දිනැති AFM(DD1)/Acct(A&MI)/ ආදායම් ණය ගැතියන් /2018 දරන ලිපිය මත පදනම්ව ඩීඩී03 හි අතිරේක මූල්‍ය කළමනාකරුගේ ශාඛාවේම බිල්පත් සහ ලෙජර පද්ධතිය සැසඳීමෙන් පසුව ලෙජර් ශේෂය සමඟ එම ශාඛාව වෙත මාරු කර ඇත. 2002 දී කොහේ හෝ විමධ්‍යගත කිරීමේ ක්‍රියාවලියේදී මෙම මුදල මාරු කර ඇත. ඉහත දක්වා ඇති කරුණුවලට වැඩිමනක් වශයෙන්, ශේෂය මාරු කිරීම බලපැවැත්වීම සඳහා කිසියම් ශේෂයක් තම අංශවලට අයත් දැයි පරීක්ෂා කිරීම සඳහා සියලුම ප්‍රාදේශීය අතිරේක මූල්‍ය කළමනාකරුවන් වෙත ද දැනුම් දෙනු ලබයි. | බලපෑමට ලක් වූ ගිණුම් නිවැරදිව පරීක්ෂා කර හඳුනා නොගත් ණයගැති ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ)2023 දෙසැම්බර් 31 දිනට එකතු කිරීමේ පාලන ගිණුමේ රු. මිලියන 378.39 ක හර ශේෂයක් සහ රු. මිලියන 2,204.57 ක බැර ශේෂයක් පැවතුණි. කෙසේ වෙතත්, නිරවුල් නොවූ රු. මිලියන 230.07 ක හර ශේෂයන් සහ රු. මිලියන 465.81 ක බැර ශේෂයන් සැසඳීම විගණනය සඳහා ලැබී නොතිබුණි. එබැවින්, එකතු කිරීමේ පාලන ගිණුමේ ශේෂවල නිරවද්‍යතාවය විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද, මූලස්ථානයේ රු. මිලියන 12.75 ක් වූ හඳුනා නොගත් ආරම්භක හර ශේෂය වසර 5 කට වැඩි කාලයක් තිස්සේ පැවතුණු බවත් බස්නාහිර පළාත දකුණ (ii) සහ සබරගමුව පළාතේ රු. මිලියන 95.27 ක් වූ ආරම්භක බැර ශේෂය වසර 01 කට වැඩි කාලයක් තිස්සේ එම ගිණුමේ පැවතුණු බවත් නිරීක්ෂණය විය. | **බෙදාහැරීමේ අංශය 01**<br>ආයතනික කාර්යාලයේ රු. මිලියන 4.29 ක මුදල සඳහා අඟුරු වූ චෙක්පත් හේතු වී තිබූ අතර එය දැන් නිරවුල් කර ඇත. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, කොළඹ නගරය සම්බන්ධයෙන්, කැලැන්ඩර මාසයේ සාමාන්‍ය සැපයුම් පාරිභෝගිකයින්ගේ සහ තොග සැපයුම් පාරිභෝගිකයින්ගේ මුදල් එකතු කිරීමේ චක්‍රය හේතුවෙන් බැර ශේෂය ඇති වී ඇත. මේ සම්බන්ධයෙන්, ආදායම් මෙහෙයුම් කමිටුවේ මාර්ගෝපදේශ අනුව තොරතුරු තාක්ෂණ පද්ධතිය සංවර්ධනය කිරීමට දැනටමත් කටයුතු කර ඇත.<br>වයඹ පළාත 1 හි මාසිකව සැසඳීම් සිදු කරන ලද අතර වයඹ පළාතේ (2) හි රු. මිලියන 222 ක නිරවුල් කර ඇත. උතුරු මැද පළාත සම්බන්ධයෙන් ගත් කල, 2011 වර්ෂයේදී සැසඳීම් නොකළ පද්ධති ගැලපීමක් ඇත.<br>**බෙදාහැරීමේ අංශය 02**<br>සටහන් කර ගෙන ඇත. ගිණුම සැසඳීමට දැනටමත් කටයුතු කර ඇති අතර එය ක්‍රියාත්මක කරමින් පවතී.<br>**බෙදාහැරීමේ අංශය 03**<br>බස්නාහිර පළාත දකුණ 2 සහ සබරගමුව පළාතේ දීර්ඝ කාලීන හිඟ නොසැඳුණු ශේෂයන් සඳහා හේතු විමර්ශනය කර ඒ අනුව | එකතු කිරීමේ පාලන ගිණුමේ දීර්ඝ කාලීන හඳුනා නොගත් හිඟ ශේෂයන් හඳුනාගෙන ඒවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය 04**<br>පෙර කාල පරිච්ඡේදය සඳහා තනි ගිණුමක් පවත්වාගෙන ගිය අතර මෙම ගිණුම නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.<br><br>**ප්‍රධාන කාර්යාලය**<br>බොහෝ නඩු නිරවුල් කිරීමට දැනටමත් පියවර ගෙන ඇති අතර ඉතිරි ශේෂය 2024 දී නිරවුල් කරනු ඇත. | |
| (ඉ) 1998 සිට 2023 දක්වා කාලය තුළදී ණයගැතියන්ගෙන් එකතු කරන ලද රු. මිලියන 75.27 ක් නිරවුල් කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව අවිනිශ්චිත ගිණුමට ඇතුළත් කර තිබුණි. | මුලින්ම නිවැරදි පාරිභෝගික ගිණුම හඳුනා ගැනීමට හෝ එම මුදල ආදායමට අය කළ යුතුද යන්න තීරණය කිරීමට ලංවිමට නොහැකි වන මුදල් සම්බන්ධයෙන් අවිනිශ්චිත ගිණුම භාවිතා කරනු ලබයි. තැපැල් කාර්යාල, මහජන බැංකුව සහ ලංකා බැංකුව වැනි නියෝජිතයන් හරහා සිදු වූ වැරදි ගෙවීම් හඳුනාගෙන නිවැරදි කිරීමට අඛණ්ඩව කටයුතු කරමින් සිටී. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඊ) මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය විසින් සිදුකරන ලද කාර්යයන් සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන 39 කින් (රජයේ සෞඛ්‍ය අංශයේ ආයතන 35 ක් ඇතුළුව) ලැබිය යුතු ශේෂයන් සම්බන්ධයෙන් රු. මිලියන 159.47 ක සමස්ත වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අදාළ රාජ්‍ය ආයතන සමඟ ශේෂයන් සැසඳීමට කටයුතු කර නොතිබුණි. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (W&AS) වාර්තාවලට අනුව, ලංවිම ලෙජරයේ දක්වා ඇති ශේෂයන් නිවැරදි ය. කෙසේ වෙතත්, අදාළ රාජ්‍ය ආයතන සමඟ ශේෂයන් සැසඳීමට පියවර ගනු ඇත. | ලැබිය යුතු ශේෂයන් තහවුරු කර ගැනීමට සහ ඒ අනුව විවාදිත වෙනස්කම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) මණ්ඩලය සහ වෙස්ට් කෝස්ට් පවර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් අත්සන් කරන ලද විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුමේ (PPA) 09 වන උපලේඛනයේ ඇමුණුම ඒ හි 02 වන වගන්තියට අනුව, බලාගාරයේ තථ්‍ය කාර්ය සාධනය මත පදනම්ව මණ්ඩලය වෙත කිසියම් වාසිදායක ගැලපීමක් සිදු කිරීමේ හැකියාව සොයා බැලීම සඳහා වගු අංක ඒ2 දරන "එකඟ වූ පරාමිතීන් සහ අගයන්" හි ඇතුළත් ඒකාබද්ධ චක්‍රීය අගයන් විශ්ලේෂණය කිරීම සඳහා පාර්ශවයන් ගිවිසුම් කාලපරිච්ඡේදයේ පළමු වර්ෂය අවසානයේදී රැස්වීමට එකඟ විය. කෙසේ වෙතත්, 2019 පෙබරවාරි 15 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල | ලංවිම හි සම්ප්‍රේෂණ අංශයේ බලශක්ති මිලදී ගැනීමේ ශාඛාවේ පොත්වලට අනුව, 2023 දෙසැම්බර් 31 වන දිනට කෝස්ට් පවර් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ශේෂය රු. මිලියන 50,032.3 ක් විය. | ආරවුල විසඳීම සඳහා දෙපාර්ශවයේම එකඟතාවය ඇතිව PPA හි පරාමිතීන් සඳහා වන අගයන් සංශෝධනය කිරීමට සහ ගෙවිය යුතු ශේෂයක් පවතී නම් එය පියවීමට කටයුතු කළ යුතුය. |

රැස්වීමේදී මාසික ඉන්වොයිසි සහතික කිරීම සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි අතරමැදි විසඳුමක් ලෙස ඒකාබද්ධ චක්‍රීය පරාමිතීන් කිහිපයක අගයන් වෙනස් කිරීමට මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබූ අතර, එම වෙනස් කළ අගයන් සඳහා සමාගමේ එකඟතාවය ලැබී නොතිබුණි. ඒ අනුව, සමාගම විසින් PPA හි නිශ්චිතව දක්වා ඇති පරාමිතීන් සඳහා වන අගයන් මත පදනම්ව ඔවුන්ගේ මාසික ඉන්වොයිසි අඛණ්ඩව ඉදිරිපත් කර තිබියේදී 2019 පෙබරවාරි සිට සමාගම විසින් ඉදිරිපත් කරන ලද මාසික ඉන්වොයිසි, පරාමිතීන් සඳහා අඩු කළ අගයන් භාවිතා කරමින් මණ්ඩලය විසින් සහතික කර තිබුණි. මෙම ආරවුල හේතුවෙන්, මණ්ඩලයේ ගිණුම් පොත් අනුව. 2023 දෙසැම්බර් 31 වන දිනට සමාගමට ගෙවිය යුතු ශේෂය රු. මිලියන 50,032.30 ක් වූ අතර සමාගමේ ගිණුම් පොත් අනුව අනුරූප ශේෂය රු. මිලියන 85,561.9 ක් විය. එබැවින්, රු. මිලියන 35,529.6 ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් වෙනස සසඳා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. මිලියන | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| කල්බදු ණය හිමියන් | 39.8 | ශේෂ තහවුරු කිරීම් | කල්බදු ණයහිමියන් පිළිබඳ ශේෂ තහවුරු කිරීම හැකි ඉක්මනින් ලබා දීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට කල්බදු ණයහිමියන්ගේ ශේෂ තහවුරු කිරීම් ඉදිරිපත් කිරීම. |

### 1.5.5 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) රු. මිලියන 1,728.36 ක් වූ නොසැසඳු සම්බන්ධිත පාර්ශව හර ශේෂ සහ රු. මිලියන 812.7 ක් වූ බැර ශේෂ නිරවුල් | පරිපාලිත ශේෂයන් සමඟ ඇති පරතරය පැහැදිලිව සසඳා අවම කර ගැනීමට සහ ගිණුම් අවසන් කිරීමේ | නොසැසඳු සම්බන්ධිත පාර්ශව ශේෂයන් නිරවුල් කිරීම සඳහා කඩිනම් |

| | | | |
|---|---|---|---|
| | කිරීමෙන් තොරව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල පිළිවෙලින් වෙනත් ණය ගැතියන් සහ වෙනත් ගෙවිය යුතු මුදල් යටතේ ගිණුම්ගත කර තිබුණි. | චක්‍රලේඛවල දක්වා ඇති මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීමට මූල්‍ය අංශය විසින් අදාළ ඒකක වෙත උපදෙස් ලබා දී ඇත. | පියවර ගත යුතුය. |
| (ii) | මණ්ඩලයේ හා ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් (පාරිතෝෂික) ගණනය කිරීම සඳහා භාවිතා කරන වට්ටම් අනුපාතය සහ කාර්ය මණ්ඩල පිරිවැටුම සම්බන්ධයෙන් ආයුගණක තක්සේරුවේ උපකල්පනවල වෙනස්කම් නිරීක්ෂණය විය. | එය යතුරු ලියන දෝෂයක් වන අතර එය නිවැරදි කරනු ඇත. | මව් සහ පරිපාලිත සමාගම්වල මූල්‍ය නොවන දත්ත මූල්‍ය ප්‍රකාශනවල සිට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන දක්වා අවශෝෂණය කර ගැනීමේදී නිසි සැලකිල්ල සහ අවධානය යොමු කළ යුතුය. |
| **සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම** | | | |
| (iii) | එස්.එල්.එෆ්.ආර්.එස් 9 ප්‍රමිතයෙහි 5.5.15 (අ) ඡේදයට අනුව සමාගම විසින් රු. මිලියන 1,553 ක් වූ වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා වෙළඳ ණය ගැතියන්ට අදාළ අපේක්ෂිත ණය අලාභ සඳහා ඓතිහාසික, වත්මන් සහ ඉදිරි දැක්ම සාධක විශ්ලේෂණය කිරීමෙන් පසු ප්‍රතිපාදන සඳහා ඇති අවශ්‍යතාවය තක්සේරු කිරීමට සමාගමට දැනුම් දීමට ලංවිම අවශ්‍ය පියවර ගනු ඇත. | ණයගැතියන්ගේ හානිකරණය සඳහා ප්‍රතිපාදන සැලසීමේදී එස්.එල්.එෆ්.ආර්.එස් 09 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (iv) | ගල් අඟුරු ආනයනය කිරීමේදී, ඇත්ත වශයෙන්ම නොදරන ලද රේගු අරමුණු සඳහා වටිනාකම නිශ්චය කිරීමේ කල්පිත ගැලපීමක් ලෙස රේගුවේදී සියයට 10 ක අංකිත මිලක් (mark-up) වටිනකමට එකතු කර තිබුණි. කෙසේ වෙතත්, සමාගම විසින් රු. මිලියන 14,904.63 ක් වූ සියයට 10 ක අංකිත මිල සමාලෝචිත වර්ෂයේ ආදායමට එකතු කර තිබූ අතර පසුව, එම මුදල ණයගැතියන්ට දුන් වට්ටමක් ලෙස හඳුනාගෙන විකුණුම් පිරිවැයට ගලපා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එස්.එල්.එෆ්.ආර්.එස් 15 හි නියම කර ඇති විධිවිධානවලට පටහැනිව, සමාලෝචිත වර්ෂයේ විකුණුම් පිරිවැය සහ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. ඉහත ගැලපීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති උපදෙස් අනුව සමාගම විසින් ගිණුම්ගත කර තිබුණි. කෙසේ වෙතත්, එය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල වීම සඳහා, සමාගම සියයට 10 ක අංකිත මිල ඇතුළත් කිරීමට ආදායම ගලපා ඇත. මෙම ගැලපීම මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලිව හෙළිදරව් කර නොමැති බව අපි පිළිගනිමු. ඉදිරියට යමින්, විනිවිදභාවය සහ එස්.එල්.එෆ්.ආර්.එස් 15 ට සහ අනෙකුත් අදාළ වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා සුදුසු හෙළිදරව් කිරීම් අප විසින් ඇතුළත් කරනු ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර අප විසින් මෙම ගිණුම්කරණ ක්‍රමය නැවත තක්සේරු කරන අතර පැහැදිලිතාව සහ අනුකූලතාව වැඩි දියුණු කිරීම සඳහා පසුකාලීන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය පැහැදිලි කිරීමේ සටහන් ඇතුළත් කරනු ඇත. | ආදායම හඳුනා ගැනීමේදී එස්.එල්.එෆ්.ආර්.එස් 15 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |

**සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (v) | මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුවේ 5.5 ඡේදයට අනුව, ගනුදෙනු හෝ වෙනත් සිදුවීම්වලින් පැන නගින වත්කම් හෝ වගකීම් මූලික වශයෙන් හඳුනා ගැනීම, ආදායම් සහ ඒ ආශ්‍රිත වියදම් යන දෙකම එකවර හඳුනා ගැනීමට හේතු විය හැක. ආදායම සහ ඒ ආශ්‍රිත වියදම් එකවර හඳුනා ගැනීම සමහර විට ආදායම සමඟ වියදම් ගැලපීම ලෙස හැඳින්වේ. කෙසේ වෙතත්, සමාගම විසින් 2017 සිට 2023 යන කාලපරිච්ඡේදය සඳහා (2021 හැර) සූර්ය බලශක්තිය මිලදී ගත් පිරිවැය වූ රු. මිලියන 4,658.2 ක් අදාළ වර්ෂවල විකුණුම් පිරිවැය ලෙස හඳුනා ගැනීම වෙනුවට, සමාගම විසින් එම පිරිවැය මණ්ඩලයෙන් ලැබිය යුතු ලෙස හඳුනාගෙන තිබුණු අතර මිලදී ගත් සූර්ය බලශක්තියේ විකුණුම් ආදායම අදාළ වර්ෂවල විකුණුම් ලෙස හඳුනාගෙන තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2023 දෙසැම්බර් 31 දිනට රඳවා ගත් ඉපැයීම්, වර්ෂය සඳහා ලාභය සහ ලැබිය යුතු ශේෂය පිළිවෙලින් රු. මිලියන 2,819.6 කින්, රු. මිලියන 1,838.6 කින් සහ රු. මිලියන 4,658.2 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ලංවිම සහ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව සමඟ පැවති සාකච්ඡාවලින් පසුව, ලංවිම විසින් මුදල් ආපසු ගෙවීමට එකඟ වී ඇත. ඒ අනුව, 2022 වර්ෂය සඳහා ඒකාකාර මිල ජාතික ගාස්තු ගැලපීමක් (UNT) ලෙස 2024 මැයි මාසයේ ඔවුන්ගේ බලශක්ති බිලෙන් අඩු කිරීමෙන් ලංවිම විසින් රු. 1,544,458,302 ක් ප්‍රතිපූරණය කර ඇත. එබැවින්, මෙම කාරණය නුදුරු අනාගතයේ දී විසඳනු ඇතැයි අපි විශ්වාස කරයි. | ආදායමට ආරෝපණය කළ හැකි විකුණුම් පිරිවැය හඳුනා ගැනීමට අදාළව මූල්‍ය වාර්තාකරණය සඳහා වන සංකල්ප රාමුවට අනුකූල විය යුතුය. |
| (vi) | 2023 දෙසැම්බර් 31 දිනට විවිධ සේවා සඳහා මණ්ඩලයෙන් අයවිය යුතු ශේෂය රු. මිලියන 5,777.8 ක් වූ අතර, මෙම ශේෂය අතරින්, රු. මිලියන 5,770.6 ක් ශුද්ධ ගිණුම්කරණය සහ නෙට් ප්ලස් ක්‍රම භාවිතා කරමින් 2017 සිට 2023 දක්වා කාලපරිච්ඡේදය තුළදී බලශක්තිය මිලදී ගැනීමේ පිරිවැය සඳහා මණ්ඩලයෙන් අයවිය යුතු ලෙස ඇතුළත් කර තිබුණි. එම රු. මිලියන 5,770.6 ක ශේෂයෙන්, 2017 සිට 2023 දක්වා කාලය සඳහා ශුද්ධ ගිණුම්කරණ සහ ශුද්ධ ප්ලස් ක්‍රම භාවිතා කරමින් බලශක්තිය මිලදී ගැනීමේ පිරිවැය සඳහා ලංවිම වෙතින් ලැබිය යුතු ලෙස ඇතුළත් කර තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලයෙන් ලද ශේෂ තහවුරු කිරීම අනුව, සමාගමට ගෙවිය යුතු ශේෂයක් නොමැති බව මණ්ඩලය තහවුරු කර තිබුණි. තවද, ශුද්ධ | ලංවිම සහ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව සමඟ පැවති සාකච්ඡාවලින් පසුව, ලංවිම විසින් මුදල් ආපසු ගෙවීමට එකඟ වී ඇත. ඒ අනුව, 2022 වර්ෂය සඳහා ඒකාකාර මිල ජාතික ගාස්තු ගැලපීමක් (UNT) ලෙස 2024 මැයි මාසයේ ඔවුන්ගේ බලශක්ති බිලෙන් අඩු කිරීමෙන් ලංවිම විසින් රු. 1,544,458,302 ක් ප්‍රතිපූරණය කර ඇත. එබැවින්, මෙම කාරණය නුදුරු අනාගතයේ දී විසඳනු ඇතැයි අපි විශ්වාස කරයි. | සම්බන්ධිත පාර්ශව ශේෂයන්ට අදාළ ආරවුල් විසඳා ගැනීමට සහ මණ්ඩලය සමඟ විධිමත් ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගිණුම්කරණ සහ නෙට් ප්ලස් ක්‍රම භාවිතා කරමින් විදුලිය මිලදී ගැනීම සඳහා පාර්ශව දෙක අතර විධිමත් ගිවිසුමක් ඇති කර ගෙන නොතිබුණි. එබැවින්, එම ශේෂයේ අයකර ගැනීමේ හැකියාව විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගත නොහැකි වූ අතර, ඉහත ලැබිය යුතු ශේෂය සඳහා සමාගම රු. මිලියන 5,300.9 ක හානිකරණ ප්‍රතිපාදනයක් සලසා තිබුණි. | | |
| (vii) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 වන වගන්තියට අනුව, වත්කම්වල සුන්බුන් අගය සහ ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම්, වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ට අනුකූලව ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දිනට කාණ්ඩ 04 කට අදාළව රු. මිලියන 11,114.4 ක ධාරණ වටිනාකමක් ඇති වත්කම්, ප්‍රමිතිවලට අනුව අවශ්‍ය පරිදි සමාලෝචනය කර ගිණුම්ගත කර නොතිබුණි. | සම්පත් සීමාවන් සහ අදාළ වත්කම්වල විවිධ ස්වභාවය හේතුවෙන්, වත්කම් කාණ්ඩ 4 ක වාර්ෂික සමාලෝචනයට වැඩි කාලයක් ගතවේ. කෙසේ වෙතත්, ඉදිරියේදී, වත්කම්වල සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කරන බවත් ඇස්තමේන්තුවල සිදුවන ඕනෑම වෙනසක් එල්.කේ.ඒ.එස් 8 ට අනුකූලව හඳුනා ගන්නා බවත් අප විසින් සහතික කරනු ඇත. | දැනටමත් භාවිතා කරනු ලබන සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් සම්බන්ධයෙන් එල්.කේ.ඒ.එස් 16 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (viii) | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ ඇන්ටි ලෙකෝ මීටරින් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් හා ලෙකෝ ප්‍රොජෙක්ට් (ප්‍රයිවට්) සමාගමේ හි මූල්‍ය ප්‍රකාශන අතර ආදායම්, විකුණුම් පිරිවැය, වෙළඳාම හා වෙනත් ගෙවිය යුතු මුදල් ආදි ශේෂයන් සම්බන්ධයෙන් පිළිවෙළින් රු. මිලියන 398.7 ක සහ රු. මිලියන 50 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | මෙම කරුණ 2024 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කරනු ඇත. | මව් සමාගමේ සහ එක් එක් පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන අයිතම ඒකාබද්ධ කරමින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිසි සැලකිල්ල සහ අවධානය යොමු කළ යුතුය. |

## 1.6 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | “ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්ට දීමනා ගෙවීම”යන මාතෘකාව යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2007 ඔක්තෝබර් 31 දිනැති අංක 07/1955/332/045 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය, 2008 මාර්තු 31 දිනැති ජාතික | | |

| | | |
|---|---|---|
| වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභා වාර්තාව සමඟ 2008 අප්‍රේල් 09 දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලා තිබුණු අතර අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් 2008 මාර්තු 31 දිනැති වාර්තාවේ දක්වා ඇති කොන්දේසිවලට යටත්ව මේ සම්බන්ධයෙන් පත් කරන ලද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ. | | |
| (i) වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2008 අප්‍රේල් 09 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද දීමනා ලැයිස්තුවට ඇතුළත් කර නොතිබූ දීමනා වර්ග 11 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ මුල් මාස 09 තුළදී රු. මිලියන 507.47 ක් ගෙවා තිබුණි. | මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කරන ලද අතර, ඔවුන්ගේ වාර්තාව සුදුසු ක්‍රියාමාර්ග සඳහා අමාත්‍යාංශයට යොමු කර ඇත. | කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීමේදී අමාත්‍ය මණ්ඩල තීරණයට සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශවලට අනුකූල විය යුතුය. |
| (ii) වෘත්තීය දීමනාවට හිමිකම් කියන නිලධාරීන්ට රඳවා ගැනීමේ දීමනාව නොගෙවිය යුතුය. කෙසේ වෙතත්, ඊට පටහැනිව, සමාලෝචිත වර්ෂයේ මුල් මාස 10 තුළදී නිලධාරීන් 517 දෙනෙකුට රඳවා ගැනීමේ දීමනාව ලෙස රු. මිලියන 99.85 ක් ගෙවා තිබුණි. | මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කරන ලද අතර ඔවුන්ගේ වාර්තාව සුදුසු ක්‍රියාමාර්ග සඳහා අමාත්‍යාංශයට යොමු කර ඇත. | කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීමේදී අමාත්‍ය මණ්ඩල තීරණයට සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශවලට අනුකූල විය යුතුය. |
| (iii) සිදු කරන ලද අහඹු පරීක්ෂණයට අනුව, තනතුරකට පත් කරන ලද නිලධාරීන්ට එම තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා දීමනා ද ගෙවනු ලබන බව නිරීක්ෂණය විය. | පොදු ව්‍යාපාර කමිටුවේ (COPE) උපදෙස් පරිදි 2008 වර්ෂයෙන් පසුව ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද දීමනා සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලෙස සාමාන්‍යාධිකාරී විසින් 2024.06.24 දිනැති ඔහුගේ ලිපිය මගින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලා ඇත. | කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීමේදී අමාත්‍ය මණ්ඩල තීරණයට සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශවලට අනුකූල විය යුතුය. |
| (iv) එකී අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව, 2008 අප්‍රේල් 01 දිනෙන් පසුව බඳවා ගන්නා ලද සේවකයින් සඳහා කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා ක්‍රමයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් හඳුන්වා දී නොතිබුණි. | වාර්ෂිකව පවත්වනු ලබන පුළුල් කාර්ය සාධන ඇගයීම් ක්‍රියාවලියක් මත පදනම්ව, නිශ්චිත දිනට පසුව බඳවා ගන්නා ලද සේවකයින් ඇතුළුව සියලුම සේවකයින්ට වැටුප් වර්ධක නිර්දේශ කරයි. | කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා ක්‍රමයක් හඳුන්වාදීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල විය යුතුය. |
| (ආ) මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව, සහනාධාර නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ සේවකයින් විසින් ලබාගෙන ඇති දේපල ණය | 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ අංක 12 (k), (m) සහ (n) වගන්ති යටතේ අධ්‍යක්ෂ | සහනාධාර නිවාස ණය යෝජනා ක්‍රමය සඳහා මහා භාණ්ඩාගාරයේ |

| | | |
|---|---|---|
| සඳහා අය කරන ලද පොලියෙන් 2/3 ක් මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කර තිබුණි. 2013 සිට 2023 දක්වා ප්‍රතිපූරණය කරන ලද පොලී මුදල රු. මිලියන 16,789.5 ක් විය. | මණ්ඩලයට පවරා ඇති බලතල යටතේ, 1983 වර්ෂයේදී නිවාස ණය ලබා ගත් ලංවිම සේවකයින්ට සහන ප්‍රදානය කිරීමේ යෝජනා ක්‍රමයක් ආරම්භ කර ඇත. සංවිධානයේ සහ රටේ අභිවෘද්ධිය සඳහා වැඩ කිරීමට ඔවුන් පෙළඹවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මේ දක්වා සේවකයින්ට මෙම ප්‍රතිලාභය අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත. | අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඇ) 2023 අගෝස්තු 07 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් සමනලවැව ජලාශයෙන් වාරිමාර්ග සඳහා ජලය මුදා හැරීම සඳහා හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කර තිබූ අතර මාස 4 සිට 6 දක්වා කාලය සඳහා මෙගාවොට් 100 ක අතිරේක විදුලිය ප්‍රසම්පාදන කිරීමට අනුමත කර තිබුණි. මෙය අනුගමනය කරමින්, මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් (PUCSL) 2023 අගෝස්තු 18 වන දින සිට අතිරේක මෙගාවොට් 100 ක ධාරිතාවක් ප්‍රසම්පාදනය කිරීමට අවසර ලබා දී තිබුණි. මණ්ඩලය විසින් ඒස් පවර් මාතර (මෙගාවොට් 23.75) සහ ඒස් පවර් ඇඹිලිපිටිය (මෙගාවොට් 93) සමඟ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කර තිබුණි. කෙසේ වෙතත්, මෙගාවොට් 116.75 ක් වූ මුළු ප්‍රසම්පාදනය මුලින් අනුමත කළ සීමාව ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය. | හදිසි අවස්ථා ප්‍රකාශයෙන් පැනනැඟුණු පරිදි, මාස 4 සිට 6 දක්වා සීමිත කාලයක් සඳහා මෙගාවොට් 100 ක අතිරේක විදුලිය ප්‍රසම්පාදනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. 2023 අගෝස්තු 17 දිනැති අංක PUC/LIC/2023/CEB/11 දරන ලිපිය හරහා PUCSL විසින් මෙගාවොට් 100 ක ජනන ධාරිතාවක් එකතු කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට අනුමැතිය ලබා දී ඇත. ඉහත බලාගාර දෙකෙහිම ඵලදායී බලාගාර ධාරිතාව මෙගාවොට් 97.31 ක් විය. | විදුලිබලය මිලදී ගැනීම අමාත්‍ය මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමත සීමාවට අනුව සිදු කළ යුතු අතර, කෙටුම්පත් විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම් අනුමැතිය සඳහා PUCSL වෙත යැවිය යුතුය. |
| (ඈ) ප්‍රසම්පාදනය කරන ලද ජනන ධාරිතාව, අනුමත ජනන ධාරිතාව ඉක්මවා යාම හේතුවෙන් (PUCSL අධ්‍යක්ෂ ජනරාල් විසින් එවන ලද 2023 ඔක්තෝබර් 09 දිනැති අංක PUC/LIC/2023/TL/21 දරන ලිපිය) සහ සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 43(5) වගන්තියට අනුව PUCSL අනුමැතිය සඳහා කෙටුම්පත් විදුලි මිලදී ගැනීමේ ගිවිසුම ඉදිරිපත් කිරීම වෙනුවට මණ්ඩලය සහ ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්ගලික) සමාගම අතර අත්සන් කරන ලද විදුලි මිලදී ගැනීමේ ගිවිසුම PUCSL වෙත ඉදිරිපත් කර තිබීම හේතුවෙන් (PUCSL අධ්‍යක්ෂ ජනරාල් විසින් එවන ලද 2023 ඔක්තෝබර් 02 දිනැති අංක PUC/LIC/2023/TL/17 දරන ලිපිය) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 43(7) වගන්තිය යටතේ | අතිරේක විදුලි බලය මිලදී ගැනීමේදී හදිසි අවශ්‍යතාවයක් පැවති බැවින් සහ ඒස් පවර් ජේනරේෂන් මාතර (පුද්.) සමාගම විසින් විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමේ කොන්දේසි අධ්‍යයනය කිරීම සඳහා වැඩි කාලයක් ඉල්ලා සිටි බැවින්, 2023 අගෝස්තු 18 වන දින ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒස් පවර් ජේනරේෂන් මාතර (පුද්.) සමාගම වෙත ප්‍රදානය කිරීමේ ලිපියක් නිකුත් කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්.) සමාගම සමඟ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමක් අත්සන් කිරීමට 2023 අගෝස්තු 29 වන දින පැවති රැස්වීමේදී, ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. | විදුලිබලය මිලදී ගැනීම අමාත්‍ය මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමත සීමාවට අනුව සිදු කළ යුතු අතර, කෙටුම්පත් විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම් අනුමැතිය සඳහා PUCSL වෙත යැවිය යුතුය. |

| | | |
|---|---|---|
| ඉහත අතිරේක විදුලි මිලදී ගැනීම් සඳහා PUCSL හි අනුමැතිය ලබා දී නොතිබුණි. ඒ අනුව, සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 13 වන වගන්තිය යටතේ විදුලිය ජනනය කිරීම සඳහා වූ බලපත්‍රය ඒස් පවර් මාතර බලාගාරයට සහ ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරයට PUCSL විසින් නිකුත් කර නොතිබුණි. | 2023 අගෝස්තු 18 වන දින වන විට බලාගාර ක්‍රියාත්මක කිරීමට PUCSL නියෝග කර තිබූ අතර එය ඒවනවිටත් දින 11 ක් ප්‍රමාද වී තිබූ බැවින්, තවදුරටත් ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා ලංවිම 2023 අගෝස්තු 29 වන දින ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්.) සමාගම සමඟ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමක් අත්සන් කර ඇත. සංසෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 43(5) වගන්තියට අනුව ලංවිම එම දිනයේම (2023 අගෝස්තු 29) PUCSL වෙත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම යවා ඇත. | |
| (ඉ) කෙටුම්පත් සාමූහික ගිවිසුමේ විධිවිධානවලට අනුව, 2021 මැයි 10 දිනැති 21/0786/318/025 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2021 ජුනි 15 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය මත පදනම්ව, මණ්ඩලය 2021 වර්ෂයේදී සේවක වැටුප් සියයට 25 කින් වැඩි කර තිබුණි. ඒ අනුව, 2020 ට සාපේක්ෂව 2021 දී කාර්ය මණ්ඩල වියදම් රු. මිලියන 9,629.9 කින්, 2022 දී රු. මිලියන 6,725.9 කින් සහ 2023 දී රු. මිලියන 8,354.7 කින් පමණ වැඩි වී තිබුණි. | 2021.05.10 දිනැති අමප/21/0786/318/025 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, 2021 ජුනි 15 වන දින පැවති විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, 2021 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි 2021-2023 කාලය සඳහා ලංවිම සේවකයින්ගේ වැටුප් සියයට 25 කින් වැඩි කිරීමට අනුමැතිය ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. | සාමූහික ගිවිසුම නීතිගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

**ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය රු. මිලියන 70,019.1 ක් විය. ඒ අතරින්, 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6,181 ක් මාස 06 කට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. තවද, රු. මිලියන 2,252.2 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් වෙළඳ ණයගැතියන් සඳහා කරන ලද හානිකරණ ප්‍රතිපාදනය රු. මිලියන 4,625.9 ක් විය. මේ | | |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් පහත සඳහන් වැඩිදුර නිරීක්ෂණ සිදු කරනු ලැබේ. | | |
| (i) | ඉහත මුළු ණයගැති ශේෂය අතරින්, දීර්ඝ කාලයක් තිස්සේ හිඟ මුදල් අයකර නොගැනීම හේතුවෙන් රු. මිලියන 2,773.3 ක් අවසන් කරන ලද ණයගැති ශේෂයක් (අක්‍රීය ණය ගැතියන්) ලෙස වර්ගීකරණය කර මාරු කර තිබූ අතර එයින් රු. මිලියන 1,106.6 ක් බෙදාහැරීමේ අංශය 01ට අදාළ විය. | **බෙදාහැරීමේ අංශය 01**<br>අවසන් කරන ලද ණයගැතියන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීම සඳහා අඛණ්ඩව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගනිමින් සිටින අතර, නිශ්චිත ගනුදෙනුකරුවන් වෙත එන්තර වාසි යවා ක්‍රියා පටිපාටියට අනුව පසු විපරම් කිරීමට පියවර ගෙන ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය 02**<br>2024 වර්ෂයෙන් අවසන් වූ මාස 05 ක කාලය තුළදී, අවසන් කරන ලද මුළු ණයගැතියන්ගෙන් රු. මිලියන 940 කට ආසන්න ප්‍රමාණයක් අයකර ගෙන ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය 03**<br>අවසන් කරන ලද ණයගැති ශේෂයන් නිරවුල් කිරීම සඳහා අවසන් කරන ලද ගිණුම්වල ශේෂයන් ආරක්ෂක තැන්පතුවලින් අයකර ගැනීම, සිහි කැඳවීම් යැවීම, පැහැර හරින ලද අවසන් කරන ලද පාරිභෝගික ගිණුම්වල ශේෂයන් සක්‍රීය ගිණුම් වෙත මාරු කිරීම වැනි ක්‍රියාමාර්ග ගෙන ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය 04**<br>චක්‍රලේඛ උපදෙස් අනුව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ණය ගැතියන්ගෙන් ලැබිය යුතු මුදල ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ii) | බෙදාහැරීමේ අංශවල අවසන් කරන ලද ණයගැතියන් අතරින්, වසර 3 කට වැඩි කාලයක් තිස්සේ රු. මිලියන 1,983.3 ක් අයවිය යුතුව පැවතුණි. එයින් රු. මිලියන 927.8 ක් බෙදාහැරීමේ අංශ 01 හි අවසන් කරන ලද ණයගැතියන් නියෝජනය කරයි. | **බෙදාහැරීමේ අංශය 01**<br>බෙදාහැරීමේ අංශය 01 හි අතිරේක සාමාන්‍යාධිකාරීගේ උපදෙස් පරිදි, දීර්ඝ කාලීන හිඟ අවසන් කරන ලද ණයගැති ශේෂයන් අයකර ගැනීම සඳහා පහත ක්‍රියාමාර්ග ගනු ලබයි.<br>1. පළාත් ආදායම් කමිටු පත් කිරීම.<br>2. පාරිභෝගිකයින්ට සිහි කැඳවීම් යැවීම.<br>3. විසන්ධි කිරීමේ වැඩසටහන්, පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන් ආදිය.<br>**බෙදාහැරීමේ අංශය 02**<br><br>2023.12.31 දිනට අවසන් කරන ලද මුළු තොග සැපයුම් ණයගැතියන්ගෙන්, 2024 වර්ෂයෙන් අවසන් වූ මාස 05 ක කාලය තුළදී රු. මිලියන 940 කට ආසන්න මුදලක් අයකර ගෙන ඇත. | මණ්ඩලයේ චක්‍රලේඛවලට අනුව, දීර්ඝ කාලීන හිඟ අවසන් කරන ලද ණය ගැතියන්ගෙන් අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| | **බෙදාහැරීමේ අංශය 03**<br>වසර දෙකකට අඩු අවසන් කරන ලද ගිණුම් සඳහා සිහි කැඳවීම් යැවීම, පැහැර හරින ලද අවසන් කළ පාරිභෝගික ගිණුම්වල ශේෂයන් සක්‍රීය ගිණුම් වෙත මාරු කිරීම වැනි ක්‍රියාමාර්ග ගෙන ඇත. | |
| (iii) සම්බන්ධතා 41,441 ක් සම්බන්ධයෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දකුණු පළාත 02) හි රු. මිලියන 104.39 ක් වූ අවසන් කරන ලද සාමාන්‍ය සැපයුම් ණයගැතියන් අතරින්, වසරකට වැඩි කාලයක් තිස්සේ රු. මිලියන 33.65 ක් අයවිය යුතුව පැවතුණි. තවද, ඉහත සම්බන්ධතා අතරින් රු. මිලියන 10.98 ක් සම්බන්ධතා 13,549 කට අදාළව බැර ශේෂ ලෙස පැවතුන බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, මණ්ඩලයේ DCC/COM/03/2009 දරන චක්‍රලේඛය අනුව ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. ඊට අමතරව, පෙර හිඟ ශේෂයන් අයකර ගැනීමට පියවර ගැනීමෙන් තොරව අවසන් කරන ලද ගනුදෙනුකරුවන්ට නව සම්බන්ධතා ලබා දී ඇති බව නිරීක්ෂණය විය. | දකුණු පළාත 02 විසින් බැර ශේෂ නිරවුල් කිරීම සම්පූර්ණ කර ඇති අතර අසාමාන්‍ය බැර ශේෂ ඉවත් කිරීම සඳහා අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 04) විසින් අනුමත කරන ලද ලේඛන තොරතුරු තාක්ෂණ ඒකකයට යොමු කර ඇත. මෙය ක්ෂේත්‍ර තුනටම සිදු කෙරේ. | මණ්ඩල චක්‍රලේඛ ප්‍රකාරව අවසන් කරන ලද ණයගැතියන් තුළ ඇති බැර ශේෂයන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු අතර නව සම්බන්ධතාවයක් ලබා දීමට පෙර සියලු හිඟ මුදල් අයකර ගෙන ඇති බවට සහතික විය යුතුය. |
| (iv)2023 ඔක්තෝබර් 31 දිනට නැගෙනහිර, උතුර සහ සබරගමුව පළාත්වල හිඟ ණයගැතියන් සම්බන්ධයෙන් සිදු කරන ලද නියදි විගණන පරීක්ෂණයට අනුව, බිල්පත් වටිනාකම රු. 50,000 ඉක්මවූ සහ වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පවතින ගනුදෙනුකරුවන් 357 දෙනෙකුගෙන් රු. මිලියන 39.65 ක හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | **බෙදාහැරීමේ අංශය 01**<br>බෙදාහැරීමේ අංශය 01 හි පළාත්වල ලැබිය යුතු මුදල්වල තත්ත්වය වැඩිදියුණු කිරීම සහ සමාලෝචනය කිරීම සඳහා අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 01) විසින් කමිටුවක් පත් කර ඇත. ඒ අනුව, උතුරු පළාතේ දීර්ඝ කාලීන හිඟ මුදල් අයකර ගැනීමට සහ ලැබිය යුතු මුදල්වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා පළාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ ප්‍රාදේශීය ඉංජිනේරුවන් වෙත රැස්වීම් කිහිපයක් පවත්වන ලද අතර ඉලක්ක ලබා දී ඇත.<br>**බෙදාහැරීමේ අංශය 03**<br>පාරිභෝගික ගිණුම් 48 න් පාරිභෝගිකයින් 19 දෙනෙකු දැනටමත් ගෙවිය යුතු මුදල් ගෙවා ඇති අතර ඉතිරි ගිණුම් 29 දැනටමත් විසන්ධි කර ඇත. | ඉහළ බිල්පත් වටිනාකමක් ඇති හිඟ ණයගැතියන් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (v) නියදි විගණන පරීක්ෂණයට අනුව, දීර්ඝ කාලයක් තිස්සේ රු. මිලියන 12.21 ක හිඟ විදුලි බිල්පත් නොගෙවීම හේතුවෙන් පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ නිල නිවාස සඳහා ලබාදී ඇති විදුලි සම්බන්ධතා 46 ක් සමාලෝචිත වර්ෂය අවසානයේදී අවසන් කරන ලද (අක්‍රිය) ණය ගැතියන් ලෙස වර්ගීකරණය කර තිබුණි. අයකර ගැනීමෙන් තොරව එයින් රු. මිලියන 11.66 ක් වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණු අතර රු. මිලියන 5.29 ක් වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. | **බෙදාහැරීමේ අංශය 01**<br>පාර්ලිමේන්තු නියෝජිතයන්ගෙන් අයකර ගැනීමෙන් තොරව ඉතිරිව ඇති හිඟ ශේෂයන් පවතින බවට එකඟ වේ. කෙසේ වෙතත්, අතිරේක සාමාන්‍යාධිකාරී සහ කොළඹ නගර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ සමීප අධීක්ෂණය සහ උපදෙස් මත, වත්මන් පාර්ලිමේන්තු නියෝජිතයන්ගෙන් රු. මිලියන 12.01 ක ශේෂයන් අයකර ගැනීමට මණ්ඩලයට හැකි වූ අතර අඛණ්ඩ අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගනිමින් සිටී.<br>**බෙදාහැරීමේ අංශය 04**<br>පාර්ලිමේන්තු නියෝජිතයින්ගේ ශේෂයන් අයකර ගැනීම සඳහා වෙළඳ ණයගැති ශේෂ අයකර ගැනීමේ ක්‍රමවේදය යොදා ගැනේ. දකුණ පළාත 02 හි එක් සැලකිය යුතු ශේෂයක් පමණක් පවතී. | පාර්ලිමේන්තු නියෝජිතයින්ගේ නිල නිවාසවලට ලබා දී ඇති සම්බන්ධතාවලින් හිඟ මුදල් අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ අනෙකුත් ණයගැතියන්ගේ ශේෂය රු. මිලියන 24,327.1 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් වැඩිදුර නිරීක්ෂණ සිදු කරනු ලැබේ. | | |
| (i) සමාලෝචිත වර්ෂය අවසානයේදී විදුලි සැපයීම වෙනුවෙන් පූජනීය ස්ථානවලින් රු. මිලියන 256.91 ක් අයවිය යුතුව පැවතුණි. එයින් රු. මිලියන 70.14 ක් වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව හිඟව පැවතුණි. තවද, බෙදාහැරීමේ අංශය 01 ට අදාළව වසර 5 කට වැඩි කාලයක් තිස්සේ පූජනීය ස්ථානවලින් රු. මිලියන 42.5 ක් අයවිය යුතුව පැවතුණි. තවද, හම්බන්තොට ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය සම්බන්ධයෙන්, තාවකාලික සම්බන්ධතා සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් 2010 අප්‍රේල් 26 වන දින අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 04) විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයට පටහැනිව ආරක්ෂක තැන්පතුවක් හෝ ඇස්තමේන්තුගත ගාස්තුවක් ලබා | **බෙදාහැරීමේ අංශය 01/02/03**<br>පූජනීය ස්ථානවලින් ලැබිය යුතු මුදල් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.<br>**බෙදාහැරීමේ අංශය 04**<br>2012 වසරේ සිට බුද්ධ ශාසන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් රු. මිලියන 8.3 ක් ලැබිය යුතු අතර, අපි විසින් බුද්ධ ශාසන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට වෙන වෙනම අරමුදල් ඉල්ලා ලියා ඇත. කෙසේ වෙතත්, අමාත්‍යාංශ දෙකෙන්ම අපට කිසිදු ධනාත්මක ප්‍රතිචාරයක් ලැබී නොමැත. එබැවින්, මෙම මුදල අයකර ගත නොහැකි බව කළමනාකාරිත්වය තීරණය කර ඇති අතර ආගමික ස්ථානවලින් අය විය යුතු හිඟ මුදල් කපා හැරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරනු ඇත. | පූජනීය ස්ථානවලින් අය විය යුතු මුදල් අයකර ගැනීමට කඩිනම් සහ සාධාරණ අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගත යුතු අතර, කපා හැරීමේ තීරණ ගැනීමට පෙර නිසි ක්‍රියා පටිපාටිය අනුගමනය කර ඇති බව සහතික කළ යුතුය.<br>තවද, අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 04) විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ ප්‍රකාරව ආරක්ෂක තැන්පතුවක් හෝ ඇස්තමේන්තුගත ගාස්තුවක් ලබා ගැනීමෙන් තොරව කිසිදු තාවකාලික සම්බන්ධතාවක් ලබා දී නොමැති බවට සහතික වීම. |

| | | |
|---|---|---|
| ගැනීමෙන් තොරව සමහර තාවකාලික සම්බන්ධතා ලබා දී තිබූ බව නිරීක්ෂණය විය. | | |
| (ii) 2023 දෙසැම්බර් 31 දිනට අනෙකුත් ණයගැතියන් තුළ ඇතුළත් කර ඇති විවිධ ණයගැතියන්ගෙන් රු. මිලියන 3,261.9 ක් අයවිය යුතුව පැවතුණි. එයින් රු. මිලියන 677.59 ක් වසරකට වැඩි කාලයක් තිස්සේ සහ රු. මිලියන 329.38 ක් වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. වසර පහකට වැඩි කාලයක් තිස්සේ ලැබිය යුතු ශේෂයන් අතරින්, රු. මිලියන 14.34 ක්, රු. මිලියන 155.61 ක් සහ රු. මිලියන 2.66 ක් පිළිවෙලින් පාරිභෝගික බල්බ ණය, ආයතන සඳහා තාවකාලික විදුලි සැපයීම සහ 2013 වර්ෂයේදී කොළඹ නගර ආදායම් කවුන්ටරයේ සිදු වූ මුදල් හිඟයෙන් ලැබිය යුතුව පැවතුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒවා අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | **බෙදාහැරීමේ අංශය 01**<br>උතුරු පළාත සම්බන්ධයෙන්, ණය අයකර ගැනීම ප්‍රමාද වන අතර, පාරිභෝගිකයින්ගෙන් ණය මුදල් අයකර ගැනීමට අඛණ්ඩව කටයුතු කරමින් සිටී.<br><br>**බෙදාහැරීමේ අංශය 02**<br>2024 වර්ෂයේ මාස 5 ක කාලය තුළදී රු. මිලියන 1.57 ක් අයකර ගෙන ඇති අතර, රු. මිලියන 1.1 ක් වූ මහින්ද චින්තනය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර තීරණය තවමත් ලැබීමට නියමිතය.<br><br>**බෙදාහැරීමේ අංශය 03/04/ සම්ප්‍රේෂණය**<br>හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත.<br>**මූලස්ථානය**<br>පාර්ලිමේන්තු නියෝජිතයින් සඳහා ආරක්ෂක ලාම්පු වෙනුවෙන් අයවිය යුතු මුදල අයකර ගැනීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරමින් පවතී. ඉතිරි ශේෂය නියමිත වේලාවට අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාවයෙන් කපා හරිනු ඇත. මහජන බැංකුවේ කවුන්ටර (POS) පිහිටුවීම සඳහා POS කවුන්ටර තැන්පතු සහ උපකරණ ලෙස හඳුනාගත් රු. මිලියන 20.5 ක මුදලක් ගෙවා ඇත. ඉතිරි මුදල අදාළ අංශ වෙත මාරු කිරීම සඳහා මූලස්ථානය අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. ඉතිරි ඕනෑම මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාවයෙන් ගිණුම් පොත්වලින් කපා හරිනු ඇත.<br><br>**ජනන අංශය**<br>ලක්විජය බලාගාරයේ 2021 ට පෙර වර්ෂවල තොග අතිරික්තයන් සහ හිඟයන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු 2024 වර්ෂයේදී තොග ගැලපුම් ගිණුමෙන් නිරවුල් කරනු ඇත.<br><br>**ව්‍යාපෘති අංශය**<br>විවිධ ණයගැති ගිණුම්වල ව්‍යාපෘති අංශ ශේෂය නිවැරදි කර ඇත. | විවිධ ණයගැතියන් අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | **වත්කම් කළමනාකරණය**<br>හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | |
| (iii) සියලුම බෙදාහැරීමේ අංශ, ජනන අංශය සහ වත්කම් කළමනාකරණ අංශයට අදාළව එකතුව රු. මිලියන 65.81 ක් වූ තොග හිඟයක් වසරකට වැඩි කාලයක් තිස්සේ විවිධ ණයගැතියන් තුළ පැවතුණු අතර, එම තොග හිඟය අතරින් රු. මිලියන 34.15 ක් ජනන අංශයේ ලක්විජය බලාගාරයට අදාළව වසර 5 කට වැඩි කාලයක් තිස්සේ අය නොවී පැවතුණි. තවද, ඉහත තොග හිඟය අතරින්, රු. මිලියන 31.66 ක් වගකිවයුතු නිලධාරීන් සමඟ හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, රු. මිලියන 2.8 ක තොග අලාභ සඳහා පමණක් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගෙන තිබුණි. | **ලක්විජය විදුලි බලාගාරය**<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු 2024 වර්ෂයේදී රු. මිලියන 34.15 ක තොග ගැලපුම් ශේෂය නිරවුල් කරනු ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය 01**<br>රු. මිලියන 13.08 ට අදාළව නීති අංශයට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවී තිබීම, සේවකයාගේ වැඩ තහනම් කිරීම, නීතිමය නඩුවක් විභාග වෙමින් පැවතීම යනාදී පැහැදිලි කිරීම් සපයා ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය 02**<br>මූලික විමර්ශනය සිදු කර ඇති අතර, ලෙජරයේ අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට තීරණය අපේක්ෂාවෙන් සිටී.<br><br>**බෙදාහැරීමේ අංශය 03**<br>සබරගමුව පළාතේ පවතින තොග හිඟයන් සඳහා දැනට සිටින සේවකයින්ගෙන් අයකර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින අතර, දීර්ඝ කාලීන හිඟ අයකර ගත නොහැකි මුදල් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.<br><br>**බෙදාහැරීමේ අංශය 04**<br>දීර්ඝ කාලීනව නොවිසඳී තිබූ කරුණු පිළිබඳව අදාළ ඒකක ප්‍රධානීන්ට දැනුම් දී ඇත. අදාළ තොරතුරු ලැබීමෙන් පසු, පියවර ගනු ඇත. | තොග හිඟය නිසා ඇති වූ අලාභ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට වහාම පියවර ගත යුතුය. |
| (iv) 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය විසින් සෝපාන, වායුසමීකරණ යන්ත්‍ර සහ විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රාජ්‍ය ආයතන 98 කින් රු. මිලියන 435.52 ක් අයවිය යුතුව පැවතුණි. එයින් රු. මිලියන 153.03 ක් සහ රු. මිලියන 83.41 ක් අයකර ගැනීමෙන් තොරව පිළිවෙලින් වසරකට සහ වසර පහකට වැඩි කාලයක් තිස්සේ හිඟව පැවතුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයේදී හානිකරණ ප්‍රතිපාදන ලෙස රු. මිලියන 110.5 | විදුලි සෝපාන, වායු සමීකරණ සහ විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රජයේ ආයතනවලින් අයවිය යුතු හිඟ මුදල අයකර ගැනීම සඳහා පසු විපරම් ක්‍රියාමාර්ග ගෙන ඇත. | රජයේ ආයතනවලින් අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ක් පමණක් වෙන් කර තිබුණි. | | |
| (v) ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම සහ ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් හරහා ලංකා ගල් අඟුරු සමාගමෙන් අය විය යුතු රු. මිලියන 714.96 ක් වසර හයකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව හිඟව පැවතුණි. | ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගමේ හිඟ මුදල් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල කමිටුවක් පත් කරන ලද අතර, අවසන් වාර්තාව වරාය සහ නාවික අමාත්‍යාංශයේ ලේකම්වරයාට සමථයකට පත් කිරීම සඳහා භාර දී ඇත. ලිබර්ටි කොමොඩිටීස් සම්බන්ධයෙන්, ලංකා ගල් අඟුරු සමාගම බේරුම්කරණ ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. ලංකා ගල් අඟුරු සමාගම සහ ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම අතර ගනුදෙනුව සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා 2024.06.19 දින විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තවත් කමිටුවක් පත් කර ඇත. ලංවිම ගිණුම් පොත්වල ලැබිය යුතු මෙම දිර්ඝ කාලීන හිඟ ශේෂය පියවන ලෙස ඉල්ලා ලංවිම සාමාන්‍යාධිකාරී විසින් 2024.05.10 දිනැති ලිපියක් ලංකා ගල් අඟුරු සමාගමේ සභාපතිවරයා වෙත ද නිකුත් කර ඇත. | අනාගතයේදී මෙවැනි ගනුදෙනු වැළැක්වීමට කටයුතු කළ යුතුය. |
| (vi) 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් ලබා දුන් තාවකාලික විදුලි සම්බන්ධතාවලින් රු. මිලියන 241.72 ක් අයවිය යුතුව පැවතුණි. එයින්, කොළඹ නගර පළාත විසින් රජයේ ආයතනවලට ලබා දුන් තාවකාලික විදුලි සම්බන්ධතාවලින් රු. මිලියන 189.67 ක් වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. | රැස්වීම් සහ සිහිකැඳවීම් ලිපි ඇතුළු ගෙවීම් එකතු කිරීමට නැවත නැවතත් උත්සාහ කළද, සමහර රජයේ ආයතන තවමත් ඔවුන්ගේ හිඟ මුදල් පියවීමට කටයුතු යොදා නොමැත. | තාවකාලික විදුලි සම්බන්ධතාවලින් අයවිය යුතු දිර්ඝ කාලීන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 7 (1) සහ 43 (1) වගන්තිය | නියාමකගෙන් බලය ලබා නොගෙන, උත්පාදන බලපත්‍රය කල් ඉකුත් වී ඇති ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 2,957.3 ක් වූ ගිගාවෝට් 27.31 ක බලශක්ති මිලදී ගෙන තිබුණි. | වාරිමාර්ග අවශ්‍යතා සඳහා සමනලවැව ජලාශයෙන් ජලය මුදා හැරීම හේතුවෙන්, 2023 අගෝස්තු 15 වන දින වන විට දකුණු කලාපයේ පවතින විදුලි බලාගාරවලින් අවශ්‍ය අතිරේක විදුලිය මිලදී ගැනීමෙන් දිවයින පුරා අඛණ්ඩ විදුලි සැපයුමක් සඳහා 2023 අගෝස්තු 07 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, මාස 06 ක කාලයක් සඳහා අවම සහතික කළ බලශක්ති ප්‍රමාණය (MGEA) කිලෝවොට් පැය 94,500,000 ක් සඳහා ඒස් පවර් ජේනරේෂන් මාතර (පුද්.) සමාගම සමඟ සහ MGEA කිලෝවොට් පැය 325,872,000 ක් සඳහා ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්.) සමාගම සමඟ ලංවිම විසින් විදුලිය මිළදී ගැනීමේ ගිවිසුම්වලට එළඹුණි. ඉහත බලාගාර දෙකෙහිම එළදායී ධාරිතාව මෙගාවොට් 97.31 ක් විය. රට තුළ ප්‍රකාශිත හදිසි අවස්ථාවකදී දිවයින පුරා අඛණ්ඩ විදුලි සැපයුමක් සඳහා වන අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුකූල වීම සඳහා සම්පූර්ණ ප්‍රසම්පාදනය ටෙන්ඩරයක් ලෙස සිදු කර ඇත. | ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ආ) 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත | | | |
| (i) 3.5 වගන්තිය | 2020 සිට 2023 දක්වා ලේඛීය අමාත්‍යාංශයට මුදා හරින ලද සේවකයින් වෙනුවෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් රු. මිලියන 286.66 ක් මණ්ඩලයට ප්‍රතිපූරණය | අමාත්‍යාංශයට මුදාහරින ලද සේවකයින්ගේ වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් ලංවිම විසින් දරන ලද වියදම් ප්‍රතිපූරණය කරන ලෙස ඉල්ලමින් ලංවිම සාමාන්‍යාධිකාරීවරයා විසින් විදුලිබල අමාත්‍යාංශයට ලිපියක් යවා ඇත. ශ්‍රී ලංකා එනර්ජිස් (පුද්) සමාගමේ සාමාන්‍යාධිකාරීවරයාගේ වැටුප | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ දැඩි ලෙස අනුකූල වීම සහතික කිරීම. |

| | | | |
|---|---|---|---|
| | කළ යුතුය. ඊට අමතරව, 2014 සිට 2023 දක්වා මණ්ඩලයෙන් නිදහස් කරන ලද ශ්‍රී ලංකා එනර්ජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සාමාන්‍යාධිකාරී ලෙස රාජකාරි කරන නිලධාරියෙකුගේ වැටුප් හා දීමනා ලෙස මණ්ඩලය විසින් රු. මිලියන 24 ක මුදලක් දරා තිබුණි. | සඳහා ප්‍රතිපූරණය එම සමාගම විසින් පියවයි. | |
| (ii) 7.7 වගන්තිය | අවම වශයෙන් කාර්තුමය වශයෙන් පරිපාලිත ආයතනවල කාර්ය සාධනය පිළිබඳව සාකච්ඡා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට භාරකාර රාජකාරියක් තිබුණද, 2024 අප්‍රේල් මාසය අවසන් වන විටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පරිපාලිත ආයතන සමාලෝචන කිරීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි. | යෝජිත ප්‍රතිසංස්කරණ සාක්ෂාත් කර ගැනීමෙන් පසු විදුලිබල ක්ෂේත්‍රයේ සියලු අංශ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නව විදුලි පනතක් සම්පාදනය වනු ඇත. එබැවින්, සාකච්ඡාවෙන් පසුව, ලංවිම ආයතනික පරිවර්තනයක ක්‍රියාවලියක යෙදී සිටින බැවින් ඉහත සඳහන් පරිදි පරිපාලිත ප්‍රතිපත්තියක් සැකසීම මෙම අවස්ථාවේදී අවශ්‍ය නොවන බව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ දැඩි ලෙස අනුකූල වීම සහතික කිරීම. |
| (ඇ)2023 පෙබරවාරි 07 දිනැති අංක 23/0199/601/009 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ගරු නීතිපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අංක 198/2024 සහ 254/2024 දරන අධිකරණ නඩු දෙකක් සඳහා බාහිර නීතිඥයෙකුගේ සේවය ලබාගෙන තිබුණි. පසුව, සේවා කාලය සඳහා රු. මිලියන 7.6 ක ඉන්වොයිසි මණ්ඩලය වෙත යොමු කර තිබුණු අතර එය නුදුරු අනාගතයේදී ගෙවීමට අපේක්ෂිත වේ. කෙසේ වෙතත්, 2024 සැප්තැම්බර් මාසය තුළදී | ගරු නීතිපතිවරයා 2024.10.30 දින SC/FR/198/2024 සහ 254/2024 දරන නඩු රඳවා ගන්නා ලද අතර මෙම නඩු 2024 නොවැම්බර් 26 වන දින නිෂ්ප්‍රභ කර ඇත. කෙසේ වෙතත්, මෙම නඩුවලදී නීතිමය ගාස්තු ලෙස රු. මිලියන 7.6 ක මුදලක් දරා නොමැත. එබැවින්, මෙම මුදල අයකර ගැනීමට පියවර ගැනීමට අවශ්‍ය නොවේ. | බාහිර නීතිඥයෙකුගේ සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීරණවල විධිවිධානවලට අනුකූල විය යුතුය. |

නීතිමය ගාස්තු ලෙස ඉන්වොයිස් කරන ලද රු. මිලියන 7.6 ක මුදල අමාත්‍ය මණ්ඩලයේ තීරණයේ සඳහන් පරිදි වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

### 1.9 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායක බදු පනතේ V වන කොටසෙහි 17 වගන්තියට පටහැනිව, 2022 වර්ෂයේ සිව්වන කාර්තුවේ සිට 2023 අගෝස්තු දක්වා ලංකා විදුලි සමාගමට විදුලිය සැපයීමේදී අය කරන ලද රු. මිලියන 1,224.1 ක සමාජ ආරක්ෂණ දායක බදු (SSCL) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත 2024 මැයි මාසය අවසන් වන විටත් ගෙවා නොතිබුණි. | මෙම ගැටළුව දැන් විසඳා ඇති අතර 2024 ජූලි මාසයේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීම පියවා ඇත. | 2022 අංක 25 දරන සමාජ ආරක්ෂක දායක බදු පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ලංකා විදුලිබල මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය බදුවලට පෙර රු. මිලියන 61,236 ක ලාභයක් වූ අතර පසුගිය වර්ෂයේ අනුරූප අලාභය රු. මිලියන 298,189 ක් විය. (නැවත සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව). එම නිසා, රු. මිලියන 359,425 කින් ලාභයේ විශාල වැඩිවීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළදී විදුලි ගාස්තු විශාල වශයෙන් ඉහළ යාම හේතුවෙන් විදුලි අලෙවි ආදායම සියයට 97 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලවල මෙම වැඩිවීමට ප්‍රධාන හේතුව විය.

තවද, සමාලෝචිත වර්ෂය සඳහා සමූහයේ මෙහෙයුම් ප්‍රතිඵලය බදුවලට පෙර රු. මිලියන 78,844 ක ලාභයක් වූ අතර පසුගිය වර්ෂයේ අනුරූප අලාභය රු. මිලියන 274,606 ක් විය. (නැවත සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව). එම නිසා, රු. මිලියන 353,450 කින් ලාභයේ විශාල වැඩිවීමක් නිරීක්ෂණය විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ සමූහයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසදා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම්වල ප්‍රතිශතයන් සමඟ පහත දැක්වේ.

| විස්තරය | විචලා මුදල වැඩිවීම/(අඩුවීම) | විචලනය | විචලනය සඳහා හේතුව |
|---|---|---|---|
| --------------- | --------------------------- | ------------ | ------------------------------- |
| | (රු.බිලියන) | % | |
| ආදායම | 305.23 | 81 | 2022 අගෝස්තු 10 සිට 2023 ඔක්තෝබර් |

| | | | |
|---|---|---|---|
| | | | 20 දක්වා පනවන ලද විදුලි ගාස්තු සංශෝධන හරහා බලශක්ති අනුපාත සහ මාසික ස්ථාවර ගාස්තු වැඩි කිරීම. . |
| විකුණුම් පිරිවැය | 62.83 | 13 | ඉන්ධන, ගල් අඟුරු සහ විදුලිය මිලදී ගැනීමේ පිරිවැය වැඩිවීම. විදුලිය බෙදාහැරීමේ මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය වැඩිවීම. |
| මූල්‍ය පිරිවැය | 19.91 | 43 | ණය ගැනීම්වල පොලී වියදම වැඩිවීම, IPP සහ NCRE ගෙවීම් සඳහා ප්‍රමාද වූ පොලී වැඩිවීම. |

## 2.3 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

### 2.3.1 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

2023 දෙසැම්බර් 31 දිනට සමූහයේ කාරක ප්‍රාග්ධනය රු. මිලියන 9,288 ක ඍණ අගයක් ලෙසින් පිළිබිඹු වූ අතර පසුගිය වර්ෂයේ (නැවත සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව). ඍණ ශේෂය රු. මිලියන 158,771 ක් විය. එබැවින්, සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 94 කින් වර්ධනය වී තිබුණි.

### 2.3.2 ස්කන්ධයට ණය

පසුගිය වර්ෂයට සාපේක්ෂව 2023 දෙසැම්බර් 31 දිනට සමූහයේ ස්කන්ධ ශේෂය රු. මිලියන 196,663 කින් හෙවත් සියයට 48 කින් වැඩි වී තිබුණි. තවද, 2023 දෙසැම්බර් 31 දිනට සමූහය විසින් යොදවා ඇති මුළු ප්‍රාග්ධනයෙන් සියයට 39 ක් හෙවත් රු. මිලියන 389,384 ක් ණය ලබාගැනීම මගින් මූල්‍යනය කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළ සමූහයේ ස්කන්ධයට ණය අනුපාතය පසුගිය වර්ෂයේ වාර්තා වූ සියයට 93 සිට සියයට 64 දක්වා අඩු වී තිබුණි.

### 2.3.3 ලාභදායීතාවය

සමාලෝචිත වර්ෂයේ ඒකකයක සාමාන්‍ය පිරිවැය රු. 40.92 ක් වූ අතර ඊට සාපේක්ෂව 2022 වර්ෂයේ එය රු. 36.15 ක් (නැවත සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව) වූ අතර ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රු. 42.86 ක් යටතේ අලෙවි කර ඇත. (පසුගිය වර්ෂයේ ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රු. 21.24 කි). ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ ඒකකයක සාමාන්‍ය දළ ලාභය රු. 1.94 ක් වූ අතර පසුගිය වර්ෂයේ ඒකකයක සාමාන්‍ය දළ අලාභය වන රු. 14.91 ට සාපේක්ෂව සාමාන්‍ය දළ ලාභය සියයට 113 කින් වැඩි වී ඇත. සමාලෝචිත වර්ෂය තුළදී විකුණන ලද විදුලිය සඳහා වන ගාස්තු කාණ්ඩය සහ ඒකකයක සහභාගය පසු ගිය වර්ෂය සමඟ සසඳා පහත වගුවේ දැක්වේ.

| කාණ්ඩය | ඒකකයක සහභාගය ( කි.වො.පැයක ) | |
|---|---|---|
| | **2023** | **2022 (නැවත සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව)** |
| | රු. | රු. |
| ගෘහස්ථ | 2.74 | (17.04) |
| ආගමික | 2.27 | (19.87) |

| | | |
|---|---|---|
| පොදු අරමුණු | 9.78 | (8.59) |
| හෝටල් | 1.36 | (14.73) |
| කාර්මික | (2.27) | (15.55) |
| රජය | 10.83 | (12.35) |
| ලෙකෝ වෙත තොග සැපයුම | (3.27) | (17.02) |
| වීදි ආලෝකකරණය | (40.89) | (36.14) |
| කෘෂිකර්මාන්තය | 21.08 | (11.15) |
| ඒකකයක සහභාගය | 1.94 | (14.91) |

ඒ අනුව, කාර්මික, ලෙකෝ වෙත තොග සැපයුම සහ වීදි ආලෝකකරණය හැර මණ්ඩලයේ අනෙකුත් සියලුම විදුලි ගාස්තු කාණ්ඩ සමාලෝචිත වර්ෂය තුළදී ධනාත්මක සහභාගයක් ජනනය කරන ලද අතර මුළු සහභාගයට ඉහළම සහභාගය කෘෂිකර්මාන්තය විසින් ලබා දී ඇත. තවද, සමාලෝචිත වර්ෂයේ මුළු සහභාගයට ඉහළම සෘණ සහභාගය වීදි ආලෝකකරණය මගින් ලබා දී ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචන

### 3.1 කාර්ය සාධනය

**(i) විදුලිබල ජනනය සහ සෘජු පිරිවැය (බෙදාහැරීම සහ සම්ප්‍රේෂණය හැර)**

මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වනුයේ රටට අඩු පිරිවැයට විදුලිය සැපයීම වුවද, විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම්වල අහිතකර කොන්දේසි, තාප විදුලිය ජනනයට දරන අධික පිරිවැය, සුළං හා අනෙකුත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගේ අඩු දායකත්වය සහ මණ්ඩලයේ අඛණ්ඩ පාඩු පියවා ගැනීම සඳහා මෑතකදී පනවන ලද විදුලි ගාස්තු සංශෝධන.හේතුවෙන් එම අරමුණ ඉටුකර ගැනීමට මණ්ඩලයට නොහැකි විය.

තවද, මණ්ඩලයේ දීර්ඝකාලීන විදුලි ජනන සැලැස්මේ සහ සම්ප්‍රේෂණ සැලැස්මේ ඇතුලත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලය හදිසි විදුලි මිලදී ගැනීම් සිදු කර තිබූ අතර එය මණ්ඩලයේ අවම පිරිවැය අරමුණට බලපා ඇත.

පසුගිය වර්ෂයට සාපේක්ෂව 2023 දී විදුලි ජනන තත්ත්වය පහත දැක්වේ.

| මූලාශ්‍රය | 2023 | 2022 | වැඩි වීම/(අඩු වීම) | |
|---|---|---|---|---|
| | ගි.වො.පැය | ගි.වො.පැය | ගි.වො.පැය | % |
| **ලංකා විදුලිබල මණ්ඩලය** | | | | |
| ජලවිදුලිය | 4,573 | 5,364 | (791) | (14.7) |
| තාප | 1,972 | 1,337 | 635 | 47.5 |
| ගල් අඟුරු | 4,646 | 5,174 | (528) | (10.2) |
| සුළං | 391 | 347 | 44 | 12.6 |
| කුඩා දූපත් (දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති | 2.7 | 2.6 | (0.1) | 3.8 |

| | | | | |
|---|---|---|---|---|
| පද්ධතිය) | | | | |
| **උප එකතුව** | **11,585** | **12,225** | **(640)** | **(5.2)** |
| **ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්** | | | | |
| ජලවිදුලිය | 1,378 | 1,377 | 1 | 0.1 |
| තාප | 1,160 | 1,128 | 32 | 2.8 |
| සුළං | 427 | 376 | 51 | 13.6 |
| අනෙකුත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති | 167 | 117 | 50 | 42.7 |
| ග්‍රිඩ් සම්බන්ධිත සූර්ය | 227 | 190 | 37 | 19.5 |
| වහලය මත සූර්ය | 632 | 530 | 102 | 19.2 |
| **උප එකතුව** | **3,991** | **3,718** | 273 | 7.3 |
| **මුළු එකතුව** | **15,576** | **15,943** | **(367)** | **(2.3)** |

ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලයේ බලාගාරවලින් ජල විදුලි ජනනය සහ නොරොච්චෝලේ බලාගාරයෙන් ගල් අඟුරු විදුලි ජනනය හැර අනෙකුත් සියලුම ප්‍රභවයන්ගෙන් විදුලි උත්පාදනය වැඩි වී තිබුණි. තවද, පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී තාපයෙන් (මණ්ඩලය) සහ අනෙකුත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තියෙන් විදුලි ජනනය පිළිවෙලින් සියයට 47.5 කින් සහ සියයට 42.7 කින් ඉහළ ගොස් තිබූ අතර, ග්‍රිඩ් සම්බන්ධිත සූර්ය සහ වහලය මත සූර්ය බලශක්තියෙන් විදුලි ජනනය ද පිළිවෙලින් සියයට 19.5 කින් සහ සියයට 19.2 කින් ඉහළ ගොස් තිබුණි. කෙසේ වෙතත්, ජූනි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ පැවති නියඟ තත්ත්වය හේතුවෙන් මණ්ඩලයේ බලාගාරවලින් ජල විදුලි ජනනය පෙර වර්ෂයට සාපේක්ෂව ගිගාවොට් පැය 791 කින් හෝ සියයට 14.7 කින් අඩු වී තිබුණි.

**(ii)** සෘජු පිරිවැය

**පසුගිය වර්ෂය හා සසඳන විට 2023 වර්ෂයේ සෘජු පිරිවැයෙහි පිරිවැය අනුව විශ්ලේෂණයක් පහත දැක්වේ.**

| **විස්තරය** | **2023** **රු. මිලියන** | **2022** **රු. මිලියන** | **වැඩි වීම/(අඩු වීම) ප්‍රතිශතය (%)** |
|---|---|---|---|
| ඉන්ධන | 120,961 | 68,875 | 75.62 |
| ගල් අඟුරු | 158,208 | 135,126 | 17.08 |
| බලශක්ති මිලදී ගැනීම | 128,004 | 121,244 | 5.58 |
| මෙහෙයුම් සහ නඩත්තුව | 65,131 | 85,615 | (23.93) |
| ක්ෂය වීම | 34,662 | 33,765 | 2.66 |
| **සෘජු පිරිවැය** | **506,966** | **444,625** | **14.02** |

ඉහත තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ඉන්ධන සහ ගල් අඟුරු මිල ඉහළ යාම හේතුවෙන් ඉන්ධන සහ ගල් අඟුරු පිරිවැය පෙර වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 75.62 කින් සහ සියයට 17.08 කින් ඉහළ ගොස් ඇති බව අනාවරණය විය.

## 3.2 අනාර්ථික ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | යෝජිත මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණයේ පයිලින් වැඩ සඳහා වන කොන්ත්‍රාත්තුව මුලින් 2012 ඔක්තෝබර් 22 වන දින රු. මිලියන 304.6 ක කොන්ත්‍රාත් මුදලකට ප්‍රදානය කර ඇත. එහි ඉදිකිරීම් සහ ඉදිකිරීම් දෝෂ නිවැරදි කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2021 අගෝස්තු 02 වන දින රු. මිලියන 4,774.6 ක (වැට් බද්ද හැර) කොන්ත්‍රාත් මුදලකට නැවත ප්‍රදානය කරන ලද අතර ආරම්භක දිනය 2021 අගෝස්තු 16 විය. කෙසේ වෙතත්, 2023 පෙබරවාරි 14 වන දින, විදුලිබල අමාත්‍යවරයාගේ උපදෙස් මත කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට මණ්ඩලය තීරණය කර තිබුණි. 2024 ජූලි 31 වන දින වන විට, කොන්ත්‍රාත්කරු 2023 අගෝස්තු මාසයේදී වැඩ අත්හිටුවා තිබුණද, කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබුණි. 2023 ඔක්තෝබර් 16 වන දින අඩු කරන ලද වැඩ විෂය පථයක් සඳහා ප්‍රමාණවත් නිම කිරීමේ සහතිකයක් නිකුත් කරන ලද අතර, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 13.2 ක් පමණක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද රු. මිලියන 1,484.9 ක් නිෂ්කාර්ය විය. | ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින අතරතුර, කොවිඩ්-19 වසංගතයේ බලපෑම, ශ්‍රම හා ද්‍රව්‍ය හිඟය, දේශීය හා ආනයනික ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ඉහළ යාම, ඉන්ධන හිඟය යනාදිය හේතුවෙන් කොන්ත්‍රාත්කරු දුෂ්කරතා රැසකට මුහුණ දී ඇත. ඒ අනුව, කොන්ත්‍රාත්කරු තමාගේම තීරණය අනුව වැඩවල ප්‍රගති අනුපාතය අඩු කර ඇත. මේ අතර, අභියෝගාත්මක කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා ගොඩනැගිල්ලේ සිදුකරමින් පවතින ඉදිකිරීම් කටයුතු සුදුසු පරිදි නැවැත්වීමට 2022 දෙසැම්බර් 07 වන දින ගරු විදුලිබල අමාත්‍යතුමා සමඟ පැවති රැස්වීමකදී උපදෙස් ලබා දී ඇත. එම අවස්ථාවේදී, බිම් මහලේ සහ පළමු මහලේ වැඩවල ප්‍රගතිය පිළිවෙලින් සියයට 80 ක් සහ 25 ක් විය. 2023 පෙබරවාරි 14 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අවශ්‍ය ආරක්ෂිත වැඩ අවසන් කිරීමෙන් පසු ඉදිකිරීම් කටයුතු නතර කිරීමට සහ ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා කොන්ත්‍රාත් ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමට තීරණය කර ඇත. ඒ අනුව, සේවායෝජකයාගේ තීරණය පිළිබඳව කොන්ත්‍රාත්කරුට දැනුම් දී ඇත. ව්‍යාපෘති උපදේශක විසින් අඩු කරන ලද විෂය පථය නිකුත් කරන ලද අතර එය කොන්ත්‍රාත්කරු විසින් 2023 අගෝස්තු 15 වන විට සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණි. මුල් විෂය පථයට අනුව ප්‍රගතිය සියයට 13.2 ක් පමණ විය. නිවැරදි කිරීමේ ක්‍රම කිහිපයක් අනුගමනය කළද, උපදේශකයා සෑහීමකට පත්වන පරිදි ඉදිකිරීම් දෝෂ සාර්ථකව නිම කිරීමට කොන්ත්‍රාත්කරු මෙතෙක් අපොහොසත් වී ඇත. නිවැරදි කිරීමේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අවසන් කිරීම ප්‍රමාද විය. කෙසේ වෙතත්, 2025 පෙබරවාරි 08 වන දින වන විට සියලුම නිවැරදි කිරීම් සම්පූර්ණ කර ව්‍යාපෘතිය භාර දෙන ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් දී ඇත. | ගොඩනැගිල්ල ආර්ථික වශයෙන් භාවිතා කළ හැකි වන පරිදි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) 1988 දී මණ්ඩලයේ ප්‍රධාන ජනන සැලැස්මේ හඳුනාගත් සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය 2022 වන විට ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණි. මුලින් ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම විසින් කළමනාකරණය කරන ලද අතර, මූලික වියදම් සඳහා රු. මිලියන 1.3 ක් වැය කිරීමෙන් පසුව එය මණ්ඩලයට මාරු කර තිබුණි. 2021 සැප්තැම්බර් 30 වන විට, මණ්ඩලය මූලික කටයුතු සඳහා රු. මිලියන 301.19 ක් වියදම් කර තිබුණද, අවසානයේ ව්‍යාපෘතිය අවසන් කර මෙගාවොට් 7 ක කුඩා ජල විදුලි බලාගාර දෙකක් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමට නැවත පැවරීමට තීරණය කර තිබුණි. මණ්ඩලයේ<br><br>වියදම් අනාර්ථික වීමට මෙම තීරණය හේතු වූ අතර, මෙම වියදම් අයකර ගැනීමට හෝ ඒවා නිසි ලෙස ගිණුම්ගත කිරීමට කිසිදු උත්සාහයක් ගෙන නොතිබුණි. | අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) විසින් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යවා ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය තවමත් ලැබීමට නියමිතය. | මණ්ඩලයේ අරමුදල් ශක්‍ය කටයුතු සඳහා භාවිතා කරන බවට සහතික වීම. |
| (iii) 2021 දී ක්‍රියාත්මක කරන ලද මන්නාරම සුළං විදුලි ජනන ව්‍යාපෘතිය විවෘත කිරීමේ උත්සවය සඳහා මණ්ඩලය විසින් රු. මිලියන 15.2 ක් වැය කර තිබූ අතර එය අනාර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය විය. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පදනම්ව රු. 1,345,914.44 ක ගෙවීම සිදු කර ඇත. තවද, රු. 9,674,887.86 ක උත්සව වියදම් අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) අංශය සහ අතිරේක සාමාන්‍යාධිකාරී (CS) අංශයේ BOS ශාඛාව විසින් හසුරුවන ලද අතර අදාළ පිරිවැය ව්‍යාපෘතියට මාරු කර ඇත. කෙසේ වෙතත්, රු. 4,261,000.00 ක මුදල අතිරේක සාමාන්‍යාධිකාරී (CS) අංශයේ BOS ශාඛාව විසින් සිදු කරන ලද අතර පිරිවැය ව්‍යාපෘති අංශයට මාරු කර ඇති නිසා අනෙකුත් ගෙවීම් පිළිබඳව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත දැනුම් දී නොමැත. | මණ්ඩලයේ අරමුදල් ආර්ථිකමය වශයෙන් භාවිතා කරන බවට සහතික වීම. |

### 3.3 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නියමිත වේලාවට ගෙවීම් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් විදුලිය මිලදී ගැනීම් සහ | තාප බලාගාර සඳහා මිලදී ගත් ඉන්ධන වෙනුවෙන් ප්‍රමාද වූ පොලිය ලෙස | පැහැර හැරීමේ පොලිය වළක්වා |

| | | |
|---|---|---|
| ඉන්ධන මිලදී ගැනීම් (ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව) සඳහා ප්‍රමාද පොලිය ලෙස සමාලෝචිත වර්ෂය තුළදී පිළිවෙලින් රු. මිලියන 16,320 ක් සහ රු. මිලියන 5,620.6 ක් දරා තිබුණි. තවද, දේශීය බැංකු ණය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ණය වාරික ආපසු ගෙවීම ප්‍රමාද කිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය තුළදී පැහැර හැරීමේ පොලිය ලෙස රු. මිලියන 10.33 කට සමාන මුදලක් ද දරා තිබුණි. | 2023.04.30 දින භාණ්ඩාගාරය විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත රු. බිලියන 14.23 ක් (2022 ජනවාරි සිට 2023 අප්‍රේල් දක්වා) පියවා ඇත. එම කාල සීමාව තුළදී මූල්‍ය ප්‍රකාශන හරහා, විදුලි ගාස්තුව එහි පිරිවැයට වඩා බෙහෙවින් අඩු වීම හේතුවෙන් රටට අඛණ්ඩ විදුලිය පවත්වා ගැනීම සඳහා බලශක්ති සැපයුම්කරුවන්ට මූල්‍යකරණය කිරීම වෙනුවට කාරක ප්‍රාග්ධන ණය තොගය සැලකිය යුතු ලෙස වැඩි කර ඇති බව ගණනය කෙරේ. මෙම තත්ත්වය තුළ, මූල්‍ය පිරිවැය වැඩිවීම පැහැදිලිය. | ගැනීම සඳහා ණය සේවා ගෙවීම් නියමිත වේලාවට ගෙවීමට අවශ්‍ය පියවර ගත යුතු අතර ප්‍රමාද ගාස්තු වැළැක්වීම සඳහා ණයහිමියන්ට නිතිපතා ගෙවීම් කළ යුතුය. |

## 3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තිය අනුව විදුලි බලය සඳහා සාධාරණ ලෙස කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට උත්පාදනය කිරීමේ පිරියතෙන් ලබා ගත හැකි ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බවට සහතික වීමට මණ්ඩලය හැකි විය යුතුය. 2018 - 2037 දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2018 සිට 2021 යන වර්ෂයන් තුළදී මෙගාවොට් 2,032 ක ධාරිතාවයකින් යුත් නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, මෙගාවොට් 661.6 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් එම කාලපරිච්ඡේදය තුළදී ක්‍රියාත්මක කර තිබුණි. 2022 - 2041 අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මේ 2022 වර්ෂයේදී මෙගාවොට් 544 ක පුනර්ජනනීය බලශක්ති ධාරිතාවක් එකතු කිරීම ඇතුළත් කර තිබුණු නමුත් මෙගාවොට් 211 ක ධාරිතාවයකින් යුත් නව පුනර්ජනනීය බලශක්ති බලාගාර පමණක් එම කාලපරිච්ඡේදය තුළදී ක්‍රියාත්මක කර තිබුණි. මීට අමතරව, 2023–2042 සඳහා අනුමත කරන ලද අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මේ 2023 දී මෙගාවොට් 607 ක මුළු ධාරිතාවකින් යුත් බලාගාර ක්‍රියාත්මක කිරීමට අරමුණු කර ගෙන තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 වන විට මෙගාවොට් 185.6 ක බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, නව උත්පාදනය බලාගාර ක්‍රියාත්මක කිරීම ඉලක්කයට වඩා සැලකිය යුතු | අමාත්‍ය මණ්ඩල තීරණ මත පදනම් වූ ප්‍රසම්පාදනය අවසන් කිරීම (මෙගාවොට් 320 ක දැවි තෙල් බලාගාර), උමා ඔය ජල විදුලි බලාගාරය සඳහා ඇමරිකා එක්සත් ජනපදය විසින් ඉරානයට පනවා ඇති සම්බාධක, රටේ සහ ලංවිමෙහි දැඩි මූල්‍ය තත්ත්වය, නැවත ටෙන්ඩර් කිරීමේ ක්‍රියාවලිය, නීතිමය ආරවුල්, මහජන විරෝධතා, මූල්‍ය ලබා ගැනීමේ දුෂ්කරතා, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දීමේ ප්‍රමාදයන් වැනි හේතු අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මේ මන්දගාමී ප්‍රගතිය සඳහා හේතු වී තිබුණි. | දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| ලෙස අඩු වූ අතර අඩු පිරිවැයකින් යුත් විදුලි බලය සැපයීමේ අරමුණ ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය තුලදී ඒකකයක සාමාන්‍ය පිරිවැය රු. 108.29 ක් වූ රු. මිලියන 2,957.3 ක් වටිනා ගිගාවොට් පැය 27.31 ක අතිරේක විදුලිබලයක් ලෙස මිලදී ගැනීමට සිදු වී තිබුණි. සාපේක්ෂව, ඒකකයක සමස්ත සාමාන්‍ය පිරිවැය සහ වෙස්ට් කෝස්ට් බලාගාරයෙන් මිලදී ගත් විදුලිය සඳහා සාමාන්‍ය පිරිවැය පිළිවෙලින් රු. 40.92 ක් සහ රු. 68.29 ක් විය. | | |
| (ආ)2022 අංක 16 දරන විදුලිබල (සංශෝධන) පනතට අනුව, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් හරහා විදුලිය නිපදවීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මත නව ජනන බලාගාරයක් සම්බන්ධයෙන් හෝ වැඩිදියුණු කරනු ලබන හෝ වැඩිදියුණු කරනු ලැබිය යුතු යම් පවතින ජනන බලාගාරයක් පුළුල් කිරීම සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කරන ලද දැන්වීමක් මත ටෙන්ඩරයක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය අදාළ නොවේ. කෙසේ වෙතත්, 2022 වර්ෂය තුළදී SLSEA වෙතින් මණ්ඩලයට ලද එකතුව මෙගාවොට් 598 ක ධාරිතාවයකින් යුතු ව්‍යාපෘති අතරින්, 2023 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 4 ක ධාරිතාවයක් සහිත බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | විදුලිබල පනත සංශෝධනය කිරීමෙන් පසු 2022-2023 කාලය තුළ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීමට හේතු කිහිපයක් බලපා ඇත.<br>• Feed-In Tariff (FIT) ක්‍රියාවලිය අත්හිටුවීම:<br>• ආර්ථික ගැටළු<br>• සුළු ජලවිදුලි බලාගාර සඳහා උනන්දුවක් නොමැතිකම<br>• SPPA ගාස්තුව තුළ සංවර්ධකයින් විසින් මුළු සම්ප්‍රේෂණ පහසුකමේ පිරිවැය තමන් විසින්ම දැරිය යුතු වීමේ අවශ්‍යතාවය. (කල්පිටිය ප්‍රදේශයේ සුළං ව්‍යාපෘති සඳහා).<br><br>තවද, ජාලය ශක්තිමත් කිරීමෙන් තොරව, NCRE ජනනය අවශෝෂණය කර ගුණාත්මක විදුලි බලයක් ලබා දීමේ හැකියාව අවදානමට ලක් විය හැකිය. | පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් හරහා විදුලිය නිපදවීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මත නව ජනන බලාගාරයක් හෝ වැඩිදියුණු කරනු ලබන හෝ වැඩිදියුණු කරනු ලැබිය යුතු යම් පවතින ජනන බලාගාරයක් පුළුල් කිරීම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන ගැටළු විසඳීමට වහාම කටයුතු කළ යුතුය. |
| (ඇ)සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා 2000 වර්ෂයට පෙර වළකාලන ලද පිරිවැය මත පදනම් වූ ගාස්තු ක්‍රමය හඳුන්වා දී තිබුණි. 2007 ට පෙර අනුමත කර ඇති NCRE ව්‍යාපෘති සඳහා පමණක් වර්තමානයේදී මෙම ගාස්තු අදාළ වන අතර දැනට NCRE ව්‍යාපෘති 28 ක් ක්‍රියාත්මක වේ. වළකාලන ලද පිරිවැය ක්‍රමය තාප විදුලි බලාගාර යැවුම් (dispatch) මත පදනම් වන | කමිටු වාර්තාව 2024.02.07 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව, බලශක්ති මිලදී ගැනීම් ශාඛාව තවමත් වළකාලන ලද පිරිවැය කාණ්ඩය යටතේ සිටින සියලුම සංවර්ධකයින්ට පිරිවැය පිළිබිඹු කරන, තාක්ෂණයට විශේෂිත වූ තිත්ව-ස්ථර ගාස්තු මත පදනම්ව | කුඩා ජල විදුලි බලාගාර සඳහා සාධාරණ උපරිම මිලක් යෙදීම සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කමිටුවේ නිර්දේශය ක්‍රියාත්මක කටයුතු |

| | | |
|---|---|---|
| අතර එය ඉන්ධන පිරිවැය අනුව වෙනස් වේ. 2020 ජනවාරි 16 දිනැති අංක ඩීජීඑම්/එස්වයිසී/ටීසීඑච්/41 දරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පද්ධති පාලන) ලිපියට අනුව නව බලාගාරද ඇතුළුව ජල විදුලි බලාගාරයක තථ්‍ය ඒකක පිරිවැය රු. 10 ට වඩා අඩු විය යුතුය. කෙසේවෙතත්, 2023 වර්ෂය සඳහා වළකාලන ලද පිරිවැය ක්‍රමය මත තීරණය කරන ලද කුඩා ජල විදුලි බලාගාරවලට අදාළ ගාස්තුව තෙත් කාලය සඳහා රු. 25.09 ක් සහ වියළි කාලය සඳහා රු. 28.46 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ ජලවිදුලි ඒකකයක සාමාන්‍ය පිරිවැය රු.3.52 ක් විය. 2022 අගෝස්තු 16 වන දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් තිබියදීත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, වළකාලන ලද පිරිවැය ක්‍රමය මත පදනම් වූ කුඩා ජල විදුලි බලාගාර සඳහා සාධාරණ උපරිම මිලක් යෙදීමට කටයුතු කර නොතිබුණි. | නව SPPAවලට එළඹෙමින් TTT වෙත මාරු වන ලෙස දැනුම් දී ඇත. වළකාලන ලද පිරිවැය මූලධර්මයේ සිට පිරිවැය පිළිබිඹු කරන, තාක්ෂණයට විශේෂිත තිත්ව ස්ථර ගාස්තු ව්‍යුහයකට මාරුවීමේ යෝජනාව සම්බන්ධයෙන්, කමිටු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් 2024.06.28 දින කමිටුවක් පත් කර තිබූ අතර කමිටුවේ නිර්දේශය සඳහා 2024.09.10 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, 2025 ජනවාරි මාසයේ සිට, ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද 2023 වර්ෂය සඳහා වූ වළකාලන ලද පිරිවැය ගාස්තුව උපරිම ගාස්තුව වශයෙන් සලකා, සෑම ව්‍යාපෘතියකම වසර 15 ක කාලය අවසන් වන තෙක්, සංවර්ධකයින් සඳහා වළකාලන ලද පිරිවැය ගාස්තු ගෙවීමට තීරණය කර ඇත. | කළ යුතුය. |
| (ඇ)මණ්ඩලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ වාර්තාවට අනුව, 2022 වර්ෂයේදී ගත් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය හේතුවෙන් විදුලිය ජනනය නොකර රන්දෙණිගල සහ රන්ටැඹේ ජලාශවල ජලය මුදා හැරීම හේතුවෙන් අතිරේක පෞද්ගලික විදුලිය මිලදී ගැනීම සඳහා මණ්ඩලයට ආසන්න වශයෙන් රු. මිලියන 262.6 ක පාඩුවක් දැරීමට සිදු වූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වගකිවයුතු නිලධාරීන්ගෙන් පාඩුව අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද, 2022 ජූලි 25 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවක් පත් කර ඇති බවත්, වාර්තාව 2022 නොවැම්බර් 16 සහ 2022 දෙසැම්බර් 08 දින ඉදිරිපත් කර ඇති බවත් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩලය එම වාර්තාව ප්‍රතික්ෂේප කර 2023 පෙබරවාරි 22 දින නව කමිටුවක් පත් කර තිබුණි. කමිටුව 2023 නොවැම්බර් 22 දින අධ්‍යක්ෂ මණ්ඩලයට තම වාර්තාව ඉදිරිපත් කර තිබුණද, කමිටුව විසින් කරන ලද නිර්දේශ 2024 මැයි මස අවසන් වන විටත් ක්‍රියාත්මක කර | කමිටුවේ නිර්දේශ සුදුසු පරිදි ක්‍රියාත්මක කරන ලෙස සාමාන්‍යාධිකාරීවරයා විසින් සියලුම අංශ ප්‍රධානීන්ට සහ ප්‍රධාන නීති නිළධරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත දැනුම් දී ඇත. | කමිටුවේ නිර්දේශ සුදුසු පරිදි ක්‍රියාත්මක කිරීමට සහ වගකිවයුතු නිලධාරීන්ගෙන් අලාභ අයකර ගැනීමට වහාම කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| නොතිබුණි. ඉහත කමිටු දෙකෙහි සාමාජිකයින් සඳහා මණ්ඩලය විසින් රු. මිලියන 1.23 ක මුදලක් ගෙවා තිබුණි. | | |
| (ඉ) රු. මිලියන 3,000 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත බහාලුම්ගත ජංගම ඩීසල් ජනක යන්ත්‍ර මිලදී ගැනීම සහ කොන්ත්‍රාත් වටිනාකම වන රු. මිලියන 2,373.32 න් සියයට 10 ක අත්තිකාරමක් ද ඇතුළුව 2023 අගෝස්තු 31 වන දිනට මණ්ඩලය විසින් කොන්ත්‍රාත්කරුට ගෙවන ලද මුදල පිළිබඳ කාර්ය සාධන විගණන වාර්තාවේ පහත නිරීක්ෂණ ඇතුළත් වේ. වාර්තාව 2023 ඔක්තෝබර් 13 වන දින පාර්ලිමේන්තුවට සභාගත කරන ලදි. | | |
| (i) ඉහත ජනක යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදනය ආරම්භ කිරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් පත්කරන ලද තාක්ෂණික ඇගයුම් කමිටුව (TEC) හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) විසින් අනුමත කල ලංසු ලේඛණ ලංසුකරුවන්ගේ අදහස් සැලකිල්ලට ගෙන අවස්ථා දෙකකදී අතිරේක වෙනස් කිරීම් සිදු කර තිබුණි. ලංසු ලේඛණවල පැවති යන්ත්‍රවල ගුණාත්මකභාවය ආරක්ෂා කරන කොන්දේසි ලංසුකරුවන් කල ඉල්ලීම පරිදි වෙනස් නොකරන ලෙස තාක්ෂණික කමිටුව ප්‍රසම්පාදන කමිටුව වෙත දන්වා තිබුණි. | මෙම ප්‍රකාශය සමඟ එකඟ වේ. | කොන්ත්‍රාත් ලේඛනයට සංශෝධන සිදු කිරීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ සලකා බැලිය යුතුය. |
| (ii) තාක්ෂණික කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ තිබියදීත්, සාරානුකූල ප්‍රතිචාර දක්වන ලංසුකරු නොවන ලංසු ලේඛනවල විශේෂ කොන්දේසිවල 23(b) සහ 23(d) වගන්තිවල අවශ්‍යතා සපුරා නොමැති සහ ජනක යන්ත්‍රවලට යොදන ඉන්ධනවල තිබිය යුතු සල්ෆර් ප්‍රතිශතයට අනුකුල නොවන ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. | මෙම ප්‍රකාශය සමඟ එකඟ වේ. | සාරානුකූල ප්‍රතිචාර දක්වන ලංසුකරුවෙකු තෝරා ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය සලකා බැලිය යුතුය. |
| (iii) ජනක යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීමේදී, සැලසුම් සහගත නොවන බිඳවැටීම් (Forced Outage), ඉන්ධන සහ ලිහිසි තෙල් නොමැතිකම සහ තාක්ෂණික දෝෂ ආදිය හේතුවෙන් ජනක යන්ත්‍ර සැලකිය යුතු පැය ගණනක් ක්‍රියාත්මක වී නොමැති බව නිරීක්ෂණය විය. තාක්ෂණික දෝෂ හේතුවෙන්, 2019, 2021, 2022 සහ 2023 වසර තුළදී පිළිවෙළින් පැය 52,452 ක්, පැය 36,120 ක්, පැය 57,320 ක් සහ පැය 35,345 ක් ජනක | ලිහිසි තෙල් නිසා කිසිදු බිඳවැටීමක් සිදු නොවීය. | තාක්ෂණික දෝෂ වළක්වා ගැනීම සඳහා ලංසු ලේඛනවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය සලකා බැලිය යුතුය. |

| | | |
|---|---|---|
| යන්ත්‍ර ක්‍රියාත්මක වී නොතිබුණි. තවද, 2020 සිට 2023 දක්වා කාලය තුළදී දරන ලද මුළු අලුත්වැඩියා පිරිවැය සහ අමතර කොටස්වල පිරිවැය පිළිවෙලින් රු. මිලියන 245.71 ක් සහ රු. මිලියන 591.88 ක් විය. | | |
| (iv) තාක්ෂණික දෝෂ හේතුවෙන් යන්ත්‍ර වරින් වර බිඳවැටීම්වලට ලක් වූ අතර සමහර ජනක යන්ත්‍ර දිගු කාලයක් අක්‍රියව පැවතුණි. 2023 නොවැම්බර් 13 වන දින සිදු කරන ලද පරීක්ෂාවට සහ විගණනයට ලද තොරතුරුවලට අනුව, මතුගම වැඩබිමේ 2022 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළදී, කොළොන්නාව වැඩබිමේ 2022 ජුනි මාසයේදී සහ මතුගම සහ හම්බන්තොට වැඩබිමේ 2023 අගෝස්තු මාසයේදී එම යන්ත්‍රවල බලාගාර ලබා ගැනීමේ සාධකය (plant availability factor) සියයට 80 කට වඩා අඩුවෙන් පැවති බව නිරීක්ෂණය විය. | වරින් වර බිඳවැටීම් සිදුවී ඇත. රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් ඉන්ධන නොමැතිකම බලාගාර ලබා ගැනීමේ සාධකයට සැලකිය යුතු ලෙස බලපා ඇත. | තාක්ෂණික දෝෂ වළක්වා ගැනීම සඳහා ලංසු ලේඛනවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය සලකා බැලිය යුතුය. |

**3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීම, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීම, මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව හදිසි විදුලි මිලදී ගැනීම, 2016 දී මණ්ඩලයේ ස්ථිර සේවකයින් සංඛ්‍යාවේ සැලකිය යුතු වැඩිවීම, මණ්ඩලයේ සේවකයින්ට අනවසර ප්‍රතිලාභ ගෙවා තිබීම හෝ ගෙවීම් කිරීම වැනි කරුණු හේතුවෙන් තෙල්, ගල් අඟුරු සහ අමතර කොටස් මිලදී ගැනීම, විදුලිබල මිලදී ගැනීම් සඳහා ගෙවීම සහ මණ්ඩලයේ ප්‍රාග්ධන වියදම් සඳහා කෙටි කාලීන ණය සහ දිගු කාලීන ණය ලබා ගැනීමට මණ්ඩලයට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය තුළදී පොලී වියදම් ලෙස මණ්ඩලයට රු. මිලියන 36,873.4 ක් දැරීමට සිදු විය. | බැංකු අයිරා, කෙටි කාලීන ණය සහ දිර්ඝ කාලීන ණය ඇතුළු විවිධ ආකාරයේ ණය ගැනීම් සඳහා ලංවිම සැලකිය යුතු පොලී වියදම් දරා ඇත. සංවිධානයේ මුදල් ප්‍රවාහ අවශ්‍යතා කළමනාකරණය කිරීම සඳහා මෙම ණය ගැනීම් අත්‍යවශ්‍ය විය. ඉන්ධන සහ ගල් අඟුරු වැනි අත්‍යවශ්‍ය යෙදවුම් ලබා ගැනීම සඳහා ණය ගැනීම ඉතා වැදගත් වූ අතර, එසේ නොමැතිව ලංවිමට විදුලිය ජනනය කිරීමට නොහැකි වනු ඇත.<br>වැඩිවන බලශක්ති ඉල්ලුම සපුරාලීමට සහ විදුලිබල ජාලයේ විශ්වසනීයත්වය පවත්වා ගැනීමට බලශක්ති නිෂ්පාදකයින්ට ගෙවීම් සහ ප්‍රාග්ධන යටිතල පහසුකම් සඳහා ආයෝජන ද අත්‍යවශ්‍ය විය. මෙම ගෙවීම් හෝ ආයෝජන ප්‍රමාද කිරීමෙන් විදුලිය බිඳවැටීම් සහ යටිතල පහසුකම් අසාර්ථක වීමේ අවදානමක් තිබූ අතර එය ආර්ථිකයට සහ සමාජයට දුරදිග යන ප්‍රතිවිපාක ඇති කිරීමට ඉඩ තිබුණි. | මණ්ඩලයේ පාලනය යටතේ පවතින සාධක නිසා ඇති විය හැකි අනවශ්‍ය පොලී වියදම් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2000 වර්ෂයේ සිට ව්‍යාපෘති කටයුතු, ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සහ ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම සඳහා රු. මිලියන 188.38 ක පිරිවැයට ඉඩම් 18 ක් මිලදී ගෙන තිබුණු අතර 2023 වර්ෂය අවසන් වන විටත් අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගෙන නොතිබුණි. එම ඉඩම් අතරින් රු. මිලියන 36.48 ක් වටිනා ඉඩම් 4 ක් බෙදාහැරීමේ අංශය 01, 02 සහ 04 හි ස්ථාවර වත්කම් ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි. තවද, නියදි විගණන පරීක්ෂණයට අනුව, අදාළ ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කර වර්ෂ 6 ක් ඉක්මවී තිබුණද, ඉඩම් දහයක් පවරා ගැනීමේ කටයුතු සම්පූර්ණ කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබූ බව නිරීක්ෂණය විය. | පහත සඳහන් හේතූන් මත මෙම ඉඩම් අපේක්ෂිත අරමුණු සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.<br>• ප්‍රවේශ මාර්ග සම්බන්ධ ගැටළු විසඳීමට නොහැකි වීම.<br>• SLLDC වෙතින් විරෝධතා<br>• රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 04/2022 මගින් ඉදිකිරීම් අත්හිටුවීම<br>• දිර්ඝ කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම කරන ලද වෙනස්කම් ආදියට | නිෂ්ක්‍රීය ඉඩම් අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමට සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.7 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) හදිසි විදුලිය ප්‍රසම්පාදනය කිරීම සඳහා මහජන උපයෝගිතා කොමිසම වෙතින් අනුමැතිය ඉල්ලා සිටින විට දකුණු පළාතේ විදුලිබල පද්ධතියේ පවතින විදුලිබල ජනනයේ සීමාවන් සහ සම්ප්‍රේෂණ ජාලයේ සීමාවන් මණ්ඩලය විසින් 2016 වසරේ සිට ඉස්මතු කර තිබුණි. කෙසේවෙතත්, වසර 02 ක සහ මාස 07 ක ප්‍රමාදයක් සහිතව දකුණු පළාතේ විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා යෝජිත පොල්පිටිය - හම්බන්තොට කි.වෝ 220 ක ධාරිතාවක් සහිත කි.මී 150 ක සම්ප්‍රේෂණ මාර්ගය 2023 අගෝස්තු 22 වන දින ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කර තිබුණි. එමෙන්ම, දකුණු පළාතේ විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා යෝජිත 2022 අප්‍රේල් 20 දින නිම කිරීමට අපේක්ෂා කර තිබූ හොරණ - පාදුක්ක කි.වෝ 132 ක ධාරිතාවක් සහිත කිලෝමීටර් 25 ක සම්ප්‍රේෂණ මාර්ගය සහ 2021 අප්‍රේල් 01 දින නිම කිරීමට | **පොල්පිටිය - හම්බන්තොට කි.වෝ 220 ක ධාරිතාවක් සහිත කි.මී 150 ක සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම**<br>සිරිපාගම කාර්නි වතුයායේ ඉඩම් ගැටළුව PUCSL විසින් විසඳන තෙක් එනම් 2023 අගෝස්තු 11 වන දින දක්වා නොවිසඳවී තිබුණි. තවද, පාස්කු බෝම්බ ප්‍රහාරය, කොවිඩ් 19 වසංගතය සහ එම කාලය තුළදී රටේ පැවති ඍණ ආර්ථික තත්ත්වය ව්‍යාපෘතියේ ප්‍රගතියට බරපතල ලෙස බලපා තිබුණි.<br><br>**හොරණ - පාදුක්ක කි.වෝ 132 ක ධාරිතාවක් සහිත කිලෝමීටර් 25 ක සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම**<br>පාස්කු බෝම්බ ප්‍රහාරය, COVID-19 වසංගතය සහ මෙම කාලය තුළ රටේ පැවති ඍණ ආර්ථික තත්ත්වය ව්‍යාපෘතියේ ප්‍රගතියට බරපතල ලෙස බලපා තිබුණි. නව විෂය පථය යටතේ, ව්‍යාපෘතිය 2024 ජනවාරි 19 වන දින වන විට නිම කර ඇත. ව්‍යාපෘතියේ ඉතිරි | දක්ෂිණ විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා යෝජනා කරන ලද සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| අපේක්ෂා කර තිබූ කි.වෝ 220 ක ධාරිතාවක් සහිත කොත්මලේ - නව පොල්පිටිය සම්ප්රේෂණ මාර්ගය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය පිළිවෙළින් සියයට 51.15 ක් සහ සියයට 59 ක් විය. තවද, කොත්මලේ - නව පොල්පිටිය ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. | කටයුතු ලංවිම විසින් සිදු කරනු ඇත.<br><br>**කි.වෝ 220 ක ධාරිතාවක් සහිත කොත්මලේ - නව පොල්පිටිය සම්ප්‍රේෂණ මාර්ගය**<br>රටේ ඇති වූ පැහැර හැරීමේ තත්ත්වය හේතුවෙන් 2022 අප්‍රේල් මාසයේ සිට ජාතික සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාල සංවර්ධන සහ කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට JICA විසින් අරමුදල් ලබා දීම අත්හිටුවා ඇත. එබැවින්, කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල 16.2(c) උප වගන්තියට අනුව, කොන්ත්‍රාත්කරු 2023 පෙබරවාරි 02 දිනැති ඔහුගේ අංක KKJV/NTDND&EIP/HO/W0353/895 දරන ලිපිය මගින් කොන්ත්‍රාත්තුව අවසන් කිරීම සඳහා කටයුතු කර ඇත. | |
| (ආ) එකතුව රු. මිලියන 32,719.06 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති තුනක් සම්බන්ධයෙන්, සැලසුම් කළ නිම කිරීමේ දිනයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මාස 26 සිට 70 දක්වා පරාසයක සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. කොන්ත්‍රාත්කරුවන්ට ලබා දුන් පළමු දිර්ඝ කිරීම තුළදී එම ව්‍යාපෘති නිම කර නොතිබුණු බවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට භෞතික ප්‍රගතිය සියයට 60 සිට සියයට 99.7 දක්වා පරාසයක පැවති බවත් තවදුරටත් නිරීක්ෂණය විය. | මෙම ප්‍රමාදයන් පහත සඳහන් හේතු නිසා සිදුවිය.<br>• ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පත් කිරීමේ ප්‍රමාදය.<br>• CACPC තීරණය හේතුවෙන් උපදේශන ප්‍රසම්පාදන ප්‍රමාදය.<br>• MASL විසින් වේලි ප්‍රතිනිර්මාණය සහ පාරිසරික බලපෑම් තක්සේරුකරණ (EIA) අනුමැතිය ප්‍රමාද කිරීම.<br>• කොවිඩ්-19 වසංගතය ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය සැපයීමට බලපා ඇත.<br>• කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය ගැටළු.<br>• කර්මාන්තශාලා පිළිගැනීමේ පරීක්ෂණ සඳහා ලංවිම සේවකයින්ගේ අනුමැතිය ප්‍රමාද වීම.<br>• පල්ලිවලට එල්ල වන ප්‍රහාර හේතුවෙන් පකිස්ථානයෙන් stringing gangs ගෙන්වා ගැනීම ප්‍රමාද කිරීම හෝ අවලංගු කිරීම.<br>• ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය.<br>• හදිසි අවස්ථා ගෙවීම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදය.<br>• කුළුණු මාර්ග ඉදිකිරීම සඳහා තෙවන පාර්ශවයකින් විරෝධතා.<br>• ගැන්ට්‍රි ඉඩම් නිරවුල් කිරීමේ ගැටළු ආදිය. | ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

**3.8 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව, 2013 අගෝස්තු 06 න් පසුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළ යුතුය. NCRE ව්‍යාපෘති සඳහා එකතුව මෙගාවොට් 390 ක ධාරිතාවයකින් යුත් ප්‍රසම්පාදන 7 ක් පමණක් 2021 දෙසැම්බර් 31 දින දක්වා ආරම්භ කර තිබුණු අතර මෙම ධාරිතාවය අතරින් 2023 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 102 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | සාමාන්‍යයෙන්, ඉහත සඳහන් සියලු ව්‍යාපෘතිවල ප්‍රගතිය කොවිඩ් -19 සංවාරක සීමාවන් සහ 2022 වර්ෂයේ සිට රට තුළ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් අඩාල විය. එබැවින්, මෙම ටෙන්ඩර්වල ලංසු තැබීමේ අදියරේදී ඉදිරිපත් කරන ලද ගාස්තු අනුපාත මත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘති සමාගම් දුෂ්කරතාවන්ට මුහුණ දුන් අතර විසඳුමක් ඉල්ලා ඇත. මෙම කාරණය අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලන ලද අතර, අමාත්‍ය මණ්ඩල තීරණ සහ විදුලිය මිළදී ගැනීමේ ගිවිසුම්වල නියමයන් සහ කොන්දේසි සැලකිල්ලට ගනිමින්, ව්‍යාපෘති අවලංගු කිරීමට සහ දීර්ඝ කිරීමට ලංවිම පියවර ගෙන ඇත. | 2021 දෙසැම්බර් 31 දක්වා ආරම්භ කර තිබූ, නිම නොකළ NCRE ව්‍යාපෘතිවල ප්‍රගතිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ඉදිකිරීම, අයිතිය සහ ක්‍රියාත්මක කිරීම (BOO) පදනම මත සියඹලාණ්ඩුවේ මෙගාවොට් 100 ක සූර්ය උද්‍යාන පහසුකම සංවර්ධනය කිරීම සහ ටර්න්කී පදනම මත කිලෝවොට් 132 ධාරිතාවයක් සහිත සම්ප්‍රේෂණ පහසුකම ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2023 අගෝස්තු 16 වන දින ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ. | | |
| (i) මෙම සමූහයේ එක් සමූහ හවුල්කරුවකු (තෝරාගත් ලංසුකරු) මූල්‍ය ශක්‍යතාවය (යෝජනා සඳහා වන ඉල්ලීම් (RFP) ලේඛනවල පළවන වෙළුමේ අංක 4.2.1, 4.2.2, 4.2.3 (i) සහ (ii) වගන්ති) යටතේ ඇති සියලුම නිර්ණායකයන්ට අනුකූල වී නොමැති බව නිරීක්ෂණය වූ අතර, ව්‍යාපෘති කමිටුව (PC) එම සමූහ හවුල්කරුගේ මූල්‍ය හැකියාවන්හි නිරීක්ෂණය වූ අනුකූල නොවීම් බැහැර වීමක් ලෙස සටහන් කර තිබුණි. | ව්‍යාපෘති කමිටුවේ ඇගයීම් වාර්තාවලට අනුව නිවැරදි වේ. | ලංසු ඇගයීමේදී RFP (යෝජනා සඳහා වන ඉල්ලීම්) හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ii) සමූහයෙන් ඉල්ලා සිටි පැහැදිලි කිරීම් සඳහා ලද ප්‍රතිචාරය සලකා බැලීමෙන් පසු, සමූහය RFP හි පළවන වෙළුමේ 4.2 වගන්තියේ දක්වා ඇති මූල්‍ය ශක්‍යතා අවශ්‍යතා සපුරා නොමැති | ව්‍යාපෘති කමිටුවේ ඇගයීම් වාර්තාවලට අනුව නිවැරදි වේ. | ව්‍යාපෘති කමිටුවේ නිර්දේශය වගකිවයුතු පාර්ශ්වයන් විසින් සලකා බැලිය යුතුය. |

| | | |
|---|---|---|
| බවත් එය බැහැර වීමක් බවත් ව්‍යාපෘති කමිටුවේ අදහස විය. කෙසේ වෙතත්, 2023 මාර්තු 22 දිනැති ව්‍යාපෘති කමිටුවේ වාර්තාව මගින් ඉහත සඳහන් කළ මූල්‍ය ශක්‍යතා බැහැර වීම් ධනාත්මකව සලකා බලා, සූර්ය උද්‍යාන පහසුකම සඳහා කිලෝවොට් පැයකට එ.ජ.ඩො ශත 7.61 ක ගාස්තුවක් සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා එ.ජ.ඩො මිලියන 1.25 ක අර්ධ වාර්ෂික ගෙවීමක් උපරිම පිළිගත හැකි අගයන් ලෙස එකඟ කර ගැනීම සඳහා සමූහය සමඟ සාකච්ඡා කිරීමට ව්‍යාපෘති කමිටුව නිර්දේශ කර තිබුණි. එසේ නොමැති නම්, දැනට ක්‍රියාත්මක RFP ක්‍රියාවලිය අවසන් කර මෙම ව්‍යාපෘතියට නව RFP ක්‍රියාවලියක් ආරම්භ කිරීමට ව්‍යාපෘති කමිටුව නිර්දේශ කර තිබුණි. | | |
| (iii) සමූහය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය යෝජනාවට අනුව, සූර්ය උද්‍යාන පහසුකම සඳහා ගාස්තුව සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන අර්ධ වාර්ෂික ගෙවීම පිළිවෙලින් කිලෝවොට් පැයකට එ.ජ.ඩො ශත 12.2 ක් සහ එ.ජ.ඩො මිලියන 1.67 ක් (යෝජිත සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම එ.ජ.ඩො මිලියන 25.58 ක් විය.) විය. සූර්ය උද්‍යාන පහසුකමට ඇතුළත් කර තිබූ සම්ප්‍රේෂණ පහසුකම් පිරිවැය ඉවත් කරමින් සමූහය විසින් 2023 මැයි 03 වන දින වෙනම යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි. සංශෝධිත යෝජනාවට අනුව, සූර්ය උද්‍යාන පහසුකම සඳහා ගාස්තුව කිලෝවොට් පැයකට එ.ජ.ඩො ශත 8.15 ක් සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන අර්ධ වාර්ෂික ගෙවීම එ.ජ.ඩො මිලියන 3.31 ක් විය. ඒ අනුව, සංශෝධනය කරන ලද සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම (සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම එ.ජ.ඩො මිලියන 50.81 ක් පමණ විය.) RFP හි පනවා ඇති උපරිම වටිනාකමට වඩා | ව්‍යාපෘති කමිටුවේ ඇගයීම් වාර්තා අනුව නිවැරදි වේ. වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී එ.ජ.ඩො මිලියන 3.31 ක අර්ධ වාර්ෂික ගෙවීම් සියයට 3.8 ක අනුපාතයකින් වට්ටම් කර ඇති බව වටහාගෙන ඇත. කෙසේ වෙතත්, ලංසු ඇගයීමෙදී / සාකච්ඡා කරන අවස්ථාවේ ප්‍රාග්ධන පිරිවැයේ වෙළඳපල අනුපාත (එ.ජ.ඩො) මෙම අගයට වඩා බෙහෙවින් වැඩි විය. එබැවින් වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී එම කාලයේ රටේ පැවති ආර්ථික තත්ත්වයට ගැලපෙන වට්ටම් කිරීම සඳහා සාධාරණ අනුපාතයක් භාවිතා කිරීමට යෝජනා කරනු ලබයි. | ලංසු ඇගයීමේදී RFP (යෝජනා සඳහා වන ඉල්ලීම්) හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම එ.ජ.ඩො මිලියන 27.3 ට වඩා අඩු විය යුතුය.) සියයට 86 කින් ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය. | | |
| (iv) | 2023 මැයි 17 දිනැති ලිපියට අනුව, සූර්ය උද්‍යාන පහසුකම සඳහා ගාස්තුව කිලෝවොට් පැයකට එ.ජ.ඩො ශත 8.00 ක් ලෙස සහ සම්ප්‍රේෂණ පහසුකමේ විෂය පථයේ යම් වෙනස්කම් සහිතව සම්ප්‍රේෂණ පහසුකම සඳහා අර්ධ වාර්ෂික ගෙවීම එ.ජ.ඩො මිලියන 2.29 ක් ලෙස සංශෝධනය කිරීමට සමූහය අවසන් වශයෙන් එකඟ වී තිබුණි. එබැවින්, සංශෝධනය කරන ලද සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම (සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම එ.ජ.ඩො මිලියන 35.13 ක් විය.) RFP හි පනවා ඇති උපරිම වටිනාකමට වඩා සියයට 29 කින් ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය. | වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී එ.ජ.ඩො මිලියන 2.29 ක අර්ධ වාර්ෂික ගෙවීම් සියයට 3.8 ක අනුපාතයකින් වට්ටම් කර ඇති බව වටහාගෙන ඇත. කෙසේ වෙතත්, ලංසු ඇගයීමේදී / සාකච්ඡා කරන අවස්ථාවේ ප්‍රාග්ධන පිරිවැයේ වෙළඳපල අනුපාත (එ.ජ.ඩො) මෙම අගයට වඩා බෙහෙවින් වැඩි විය. එබැවින් වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී එම කාලයේ රටේ පැවති ආර්ථික තත්ත්වයට ගැලපෙන වට්ටම් කිරීම සඳහා සාධාරණ අනුපාතයක් භාවිතා කිරීමට යෝජනා කරනු ලබයි. | ලංසු ඇගයීමේදී RFP (යෝජනා සඳහා වන ඉල්ලීම්) හි විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (v) | ආනයන බදු නිදහස් කිරීම හෝ ප්‍රතිපූරණය කිරීම පිළිබඳව RFP හි සඳහන් කොන්දේසි සැලකිල්ලට ගනිමින් එය තීරණය කළ යුතු බව මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා නිරීක්ෂණය කර තිබියදී සහ එවැනි කොන්දේසි RFP හි සඳහන් කර නොමැති විටදී සම්ප්‍රේෂණ පහසුකම සඳහා අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුමේ අංක 8.1.3 (iv) (b) වගන්තියට අනුව, ව්‍යාපෘති සමාගම විසින් යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, උපකරණ සහ ද්‍රව්‍ය ආනයනය සඳහා ව්‍යාපෘති සමාගම විසින් ගෙවිය යුතු රේගු හා අනෙකුත් ආනයන බදු, තීරුබදු, අය බදු සහ ගාස්තුවලින් (වැට් සහ SSCL ඇතුළුව) නිදහස් කිරීම් ලබා දී නොමැති නම්, අංක 5.3.4 වගන්තියට අනුව ප්‍රතිපූරණ ඉන්වොයිසියක් ඉදිරිපත් කිරීම මගින් බදු, තීරුබදු, අය බදු සහ ගාස්තු (SSCL ඇතුළුව) ප්‍රතිපූරණය කර ගැනීමට ව්‍යාපෘති සමාගමට අයිතියක් | අවසාන අර්ධ වාර්ෂික වටිනාකමට පැමිණීම සඳහා ලංසුකරු සමඟ සිදු කරන ලද සාකච්ඡා අතරතුර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා කමිටුව විසින් තීරණය කරන ලද පරිදි, RFP හි එය විශේෂයෙන් සඳහන් කර නොතිබුණද, සම්ප්‍රේෂණ පහසුකම සංවර්ධනයට අදාළ බදු සහ අය බදු නිදහස් කිරීමට හෝ ලංවිම විසින් ප්‍රතිපූරණය කිරීමට නියමිත විය. සාමාන්‍යයෙන්, ලංවිම හි සියලුම ටර්න්කී පදනම මත වන සම්ප්‍රේෂණ ව්‍යාපෘතිවලදී, ව්‍යාපෘතියට අදාළ බදු සහ අය බදු නිදහස් කිරීම හෝ ලංවිම විසින් කොන්ත්‍රාත්කරුට ප්‍රතිපූරණය කිරීම සිදු කරනු ලබයි. කෙසේ වෙතත්, අධීක්ෂණයක් හේතුවෙන්, නිකුත් කරන ලද RFP ලේඛනයේ එය විශේෂයෙන් සඳහන් කර නොමැත. තවද, ලංවිම විසින් ඇස්තමේන්තු කරන ලද සම්ප්‍රේෂණ පහසුකමේ උපරිම වටිනාකම (එ.ජ.ඩො මිලියන 27.3ක) ද බදු සහ අය බදුවලින් තොර විය, එනම් එය කලින් නිම කරන ලද ටර්න්කී පදනම මත වන ව්‍යාපෘතිවල අනුපාත මත පදනම්ව ඇස්තමේන්තු කර ඇති බැවිනි (බදු සහ අය බදු ටර්න්කී පදනම මත වන කොන්ත්‍රාත් | මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් නිරීක්ෂණය කරන ලද පරිදි, ලංසුකරුට බදු නිදහස් කිරීමේදී හෝ ප්‍රතිපූරණය කිරීමේදී RFP ලේඛනයේ විධිවිධාන සැලකිල්ලට ගත යුතුය. |

| | | |
|---|---|---|
| ඇත. තවද, එ.ජ.ඩො මිලියන 3.27 ක් වූ රේගු නිශ්කාශනය (CUSDEC) මත ඇස්තමේන්තුගත රේගු බදු සහ අනෙකුත් අය බදු සැලකිල්ලට ගැනීමෙන් පසු සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම (සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම එ.ජ.ඩො මිලියන 39.96 ක් විය) RFP හි පනවා ඇති උපරිම වටිනාකමට වඩා සියයට 46 කින් තවදුරටත් ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය. | මිලෙහි කොටසක් නොවන විට). | |
| (vi) 2023 මැයි 15 වන දින පැවති රැස්වීමේදී, සූර්ය උද්‍යාන පහසුකම සඳහා කිලෝවොට් පැයකට එ.ජ.ඩො ශත 8.00 ක් සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා එ.ජ.ඩො මිලියන 2.29 ක අර්ධ වාර්ෂික ගෙවීමක් යටතේ කොන්ත්‍රාත්තුව සමූහයට ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා කමිටුව (CANC) තීරණය කර තිබුණි. 2023 ජූලි 17 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඒ සඳහා අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, සමූහයට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ව්‍යාපෘති කමිටුව විසින් CANC වෙත කිසිදු නිර්දේශයක් කර නොමැති බව නිරීක්ෂණය විය. තවද, සූර්ය උද්‍යාන පහසුකම සඳහා පිළිගත් ගාස්තුව සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා පිළිගත් අර්ධ වාර්ෂික ගෙවීම, 2023 අප්‍රේල් 27 දිනැති වාර්තාව මගින් ව්‍යාපෘති කමිටුව විසින් නිර්දේශ කරන ලද සූර්ය උද්‍යාන පහසුකම සඳහා කිලෝවොට් පැයකට එ.ජ.ඩො ශත 7.62 ක උපරිම පිළිගත හැකි ගාස්තුව සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා එ.ජ.ඩො මිලියන 1.994 ක උපරිම පිළිගත හැකි අර්ධ වාර්ෂික ගෙවීම ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති කමිටුව විසින් සපයන ලද ඇගයීම් දත්ත මත පදනම්ව, ලංසුකරු සමඟ අවසන් සාකච්ඡා CANC විසින් පවත්වන ලද අතර, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ තීරණය CANC වෙත පවරා ඇති අතර එය අවසානයේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත. | ලංසුකරුවන් තෝරා ගැනීමේදී ව්‍යාපෘති කමිටුව විසින් කරන ලද නිර්දේශ සලකා බැලිය යුතුය. |
| (vii) මෙවැනි ප්‍රසම්පාදනයක් සඳහා RFP දෙකක් ඉදිරිපත් වීම සහ තාක්ෂණික ඇගයීම සහ මූල්‍ය ඇගයීම සඳහා RFP එකක් පමණක් සලකා බැලීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙන් | ව්‍යාපෘතියේ සංකීර්ණ ස්වභාවය, පහසුකම් දෙකෙහිම සුදුසුකම් ඇගයීමේ අවශ්‍යතා, නැවත ටෙන්ඩර් කිරීමේ ක්‍රියාවලිය සඳහා ගතවන කාලය වැනි කරුණු සැලකිල්ලට ගනිමින් CANC සිය අවසාන තීරණය ගෙන | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට තීරණ ගැනීමට පෙර ඵලදායී සම්පූර්ණ කිරීමක් සිදු කර ඇති |

| | | | |
|---|---|---|---|
| | අපේක්ෂා කළ පරිදි තරඟකාරිත්වයක් නිර්මාණය වී නොතිබුණි. එබැවින්, සූර්ය උද්‍යාන පහසුකම සහ සම්ප්‍රේෂණ පහසුකම යන දෙකටම වඩාත් වාසිදායක මිලක් ලබා ගැනීමේ අවස්ථාව මණ්ඩලයට අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. තවද, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 7.12.1 වගන්තියට අනුව ඵලදායී තරඟකාරිත්වයක් නොමැතිකම පැහැදිලිව පෙනෙන විට ලද සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීම සාධාරණීකරණය කළ හැකි බව නිරීක්ෂණය විය. | ඇති බව ලංවීම හි අදහස වේ. CANC සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පසුව, පිරිනමන ලද ගාස්තු අවම පිරිවැය මූලධර්මයට අනුකූල වන බවට අනුමත කරමින් ශ්‍රී ලංකා විදුලිබල පනතේ 43(7) වගන්තියට අනුව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) විසින් ද යෝජිත ගාස්තුව අනුමත කර ඇත. | බවට සහතික වීම. |
| (ඇ) | 2023 මාර්තු 07 වන දින ගත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මණ්ඩලයේ ඉල්ලුම් පාර්ශවීය කළමනාකරණ ඒකකය ස්ථාපිත කර තිබූ අතර, එහි මෙහෙයුම්වලින් මාස 8 කට පසු, 2023 ඔක්තෝබර් 31 දින ගත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව එහි ක්‍රියාකාරකම් අත්හිටුවීමට තීරණය කර තිබුණි. මෙම කෙටි කාලය තුළ, විදුලි පරිභෝජනය අඩු කිරීමේ සහ ඉල්ලුම කළමනාකරණය කිරීමේ වැදගත්කම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ නියම කර ඇති පරිදි නිසි ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය නොකර බාහිර සංවිධාන 03 ක් හරහා රු. මිලියන 14.33 ක් වැය කරමින් වීඩියෝ 18 ක් සකස් කර තිබුණි. තවද, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්තාවට අනුව, මෙම වීඩියෝ සජීවීව පටිගත කිරීමෙන් තොරව පරිගණක සජීවිකරණය මගින් නිෂ්පාදනය කර තිබුණි. එබැවින්, ඉහත කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන් විසින් දක්වා ඇති පරිදි ඇත්ත වශයෙන්ම සිදු නොකළ ක්‍රියාකාරකම් සඳහා මණ්ඩලය රු. මිලියන 6.4 ක් ගෙවා තිබුණි. | මෙම ගැටළුව සම්බන්ධයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023.10.31 දින අංක 23.14430F දරන රැස්වීම් වාර්තාවෙන් තීරණයක් ලබා දී ඇත. මෙම සිද්ධිය මූලික පරීක්ෂණ සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත මාරු කර ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ විශේෂ විමර්ශන වාර්තාවට අනුව, කළමනාකාරිත්වය දැනටමත් ප්‍රචාරක කළමනාකරු සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (ඉල්ලුම් පාර්ශවීය කළමනාකරණය) සේවය අත්හිටුවා ඇත. එසේම, මේ සඳහා වැඩිදුර විමර්ශන කටයුතු සිදු කරමින් පවතී. | විනිවිදභාවය සඳහා ටෙන්ඩර් ප්‍රදානය කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ දක්වා ඇති විධිවිධාන අනුගමනය කළ යුතුය. තවද, කොන්ත්‍රාත්කරුවන් විසින් සිදු නොකරන ලද ක්‍රියාකාරකම් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් හේතුවෙන් මණ්ඩලයට සිදු වූ අලාභ වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

**4. අනෙකුත් කරුණු**

එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි විගණනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමඟ, රාජ්‍ය සමාගම්වල විගණනය විගණකාධිපතිවරයාගේ විෂය පථයට ඇතුළත් වූ අතර, එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ප්‍රයිවට් ලිමිටඩ් සහ එහි පරිපාලිත සමාගම්වල විගණනයට අදාළව, එල්.ටී.එල් ට්‍රාන්ස්ෆෝමර්ස් හෝල්ඩින්ග්ස් ප්‍රයිවට් ලිමිටඩ් හි සේවක සංගමය, වෙනත් පුද්ගලයින් දෙදෙනෙක් සමඟ ගරු අභියාචනාධිකරණයේ ගොනු කරන ලද අධිකරණ නඩුවක් මගින් සහ H.D. චමින්ද සහ තවත් 15 දෙනෙකු විසින් ගරු අභියාචනාධිකරණයේ ගොනු කරන ලද තවත් අධිකරණ නඩුවක් මගින් එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ප්‍රයිවට් ලිමිටඩ් ව්‍යවස්ථාපිත විගණනයට එරෙහිව 2020 ජුලි 10 වන දින අතුරු තහනම් නියෝගයක් ලබාගෙන තිබුණි. එසේ තිබියදීත්, 2022 ඔක්තෝබර් 10 දිනැති අධිකරණ නියෝගයෙන් එම බාධාව ඉවත් කරන ලද අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විගණකාධිපතිවරයාට පවරා ඇති විධිවිධානවලට අනුකූලව මාගේ මඟ පෙන්වීම යටතේ එම සමාගමේ විගණනය සිදු කළ හැකිව තිබුණි. කෙසේ වෙතත්, ඒ අවස්ථාවේදී, එම සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමේදී පත් කරන ලද විගණකවරුන් ඉවත් කිරීම සඳහා පැවැත්වීමට යෝජනා කරන ලද විශේෂ මහා සභා රැස්වීම පැවැත්වීමට එරෙහිව වාණිජ මහාධිකරණයෙන් ලබාගත් අතුරු නියෝගය උපුටා දක්වමින් එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ප්‍රයිවට් ලිමිටඩ් හි විගණනය සිදු කිරීමට මාගේ කාර්ය මණ්ඩලයට බාධා කර තිබුණි. ඉහත කරුණු හේතුවෙන්, 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා එම සමාගමේ විගණනය මාගේ මඟ පෙන්වීම යටතේ සිදු කිරීමට නොහැකි විය. | මෙම කරුණ බලශක්ති අමාත්‍යාංශය වෙත යොමු කිරීමට ලංවිම විසින් කටයුතු කර ඇත. | ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ ජාතික විගණන පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) 2024 ජනවාරි 01 වන දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, 2024 පෙබරවාරි 01 වන දින පැවති මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, වෙස්ට් කෝස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත හිඟ මුදල්වලින් කොටසක් පියවීම සඳහා එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි සියයට 63 ක කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 28 ක් විදුලිබල මණ්ඩලය විසින් පැවරීමට තීරණය කර තිබුණි. ඒ අනුව, 2024 පෙබරවාරි 07 වන දින එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් විසින් රු. බිලියන 26.08 ක ප්‍රතිෂ්ඨාවකට කොටස් 919,517,200 ක් වෙස්ට් කෝස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත මාරු කර තිබුණි. කෙසේ වෙතත්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 72 වන වගන්තියට අනුව ප්‍රතිලෝම කොටස් දැරීම් (crossholding) සම්බන්ධයෙන් ගරු. නීතිපතිවරයාගෙන් නීතිමය නිෂ්කාශනය ලබා ගෙන නොතිබුණි. තවද, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් සහ රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිරීක්ෂණවල උපදෙස් පරිදි මණ්ඩලය විසින් එල්.ටී.එල් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් සහ එහි පරිපාලිත සමාගම් වෙත ඇති සියලුම වගකීම් පියවා නොතිබුණි. | අදාළ සමාගම ඔවුන්ගේ ආයතනික නීතිඥයින්ගෙන් ලබාගත් නීතිමය මතය ඉදිරිපත් කර ඇත. එල්.ටී.එල් යනු ලංවිම හි එකම ට්‍රාන්ස්ෆෝමර් සහ ගැල්වනයිසින් සැපයුම්කරු වේ. මෙම ගනුදෙනුවලදී ලංවිම එකඟ වූ ණය කාල සීමාවක් භුක්ති විඳින අතර දී ඇති ඕනෑම අවස්ථාවක ඒවා ජංගම වගකීම්වල, දිගු කාලීන වගකීම්වල, මූල්‍ය කල්බදුවල, අසම්භාව්‍ය වගකීම්වල සහ මාර්ගස්ථ තොග ගිණුම්වල හෙළිදරව් කරනු ලබයි. මෙම වගකීම් ලංවිම විසින් අඛණ්ඩ පදනමක් මත පියවනු ලබයි. එබැවින්, කොටස් හුවමාරුවට පෙර සියලුම වගකීම් පියවීමට නොහැකි ය. | වෙස්ට් කෝස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත කොටස් පැවරීම සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් කරන ලද නිරීක්ෂණවලට අනුකූල විය යුතුය. |
| (iii) අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි කොටස් හුවමාරු ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ කොටස් උපලබ්ධි කර ගැනීම සඳහා මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇති සම්පූර්ණ අනුමැතිය භාණ්ඩාගාරයට දැනුම් දී නොතිබුණි. | WPCL හි බහුතරය භාණ්ඩාගාරය සතු වන අතර WCPL සහ ලංවිම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දෙකෙහිම භාණ්ඩාගාර නියෝජිතයින් සහභාගී වේ. ලංවිම සහ WPCL අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ අනුමැතීන් ලබා දීමට පෙර කොටස් හුවමාරුව පිළිබඳව පුළුල් ලෙස සාකච්ඡා කර ඇත. අදාළ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ 2024 මාර්තු 11 දිනැති ලංවිම ලිපිය මගින් භාණ්ඩාගාරයට දැනුම් දී ඇත. පසුව, කොටස් ගනුදෙනු ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම ඇගයීම සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්, ලංවිම සභාපති සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ සමඟ රැස්වීමක් පවත්වා ඇත. | වෙස්ට් කෝස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් කොටස් පැවරීම සම්බන්ධයෙන් අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් දෙන ලද උපදෙස් වලට අනුකූල විය යුතුය. |